යොමු අංකය : වා/පස/2/34 (1).

වයඹ පළාත් සභාව

## වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාතේ පාරිසරික ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1990.12.27 වැනි දින සම්මත කරන ලදුව 1991.01.10 වැනි දින ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1992 මැයි මස 26 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

### වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාතේ පාරිසරික ප්‍රඥප්තිය

*වයඹ පළාතේ පාරිසරික අධිකාරියක් පිහිටුවීම සඳහා ද, එම අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන් පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද, පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ අභිවර්ධනය කිරීම සඳහා ද පරිසරයේ ගුණත්වය විධිමත් කිරීම, පවත්වාගෙනයාම සහ එය පාලනය කිරීම සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යනුවෙන් මෙම ප්‍රඥප්තිය හඳුන්වනු ලැබේ. මෙහි මින්මතු " විෂය භාර අමාත්‍යවරයා " ලෙස ද හඳුන්වනු ලබන පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් පනවනු ලබන ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

### *I වැනි කොටස*

#### වයඹ පළාත් පාරිසරික අධිකාරියක් සහ පාරිසරික උපදේශක සභාවක් පිහිටුවීම

02. (1) මෙම ප්‍රඥප්තිය කාර්යයන් සඳහා වයඹ පළාත් පාරිසරික අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවිය යුතුය. එය "පළාත් අධිකාරිය" යන ලුහුඬු නාමයෙන් මෙහි මින්මතු හඳුන්වනු ලැබේ. පළාත් අධිකාරියක් පිහිටුවීම.

(2) පළමු වැනි උප වගන්තිය යටතේ පිහිටුවනු ලබන මෙම පළාත් අධිකාරිය 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ තත්කාලීන සාමාජිකයින් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

(3) එකී පළාත් අධිකාරිය සංස්ථාවක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් පළාත් අධිකාරිය විසින් නඩු පවරනු ලැබීමට ද එම පළාත් අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීමට ද කළ හැකිය.

03. (1) විෂය භාර අමාත්‍යවරයා විමසා වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් සිදෙනෙකුගෙන් පළාත් අධිකාරිය සමන්විත වන අතර — පළාත් අධිකාරියේ සාමාජිකයින් සහ ලේකම්.

(අ) ඉන් එක් අයෙකු පරිසර විෂය පිළිබඳව ප්‍රමාණවත් විශේෂඥතාවයක් හා පුද්ගලකම් ඇත්තකු විය යුතුය ;
තවද ;

(ආ) ඉන් එක් තැනැත්තෙකු පාරිසරික කළමනාකරණය පිළිබඳ යෝග්‍ය පරිපාලන කුසලතාවයක් හා ඒ පිළිබඳ පළපුරුද්දක් ඇත්තකු හෝ පාරිසරික සංරක්ෂණය සඳහා ක්‍රියා කරන යම් සංවිධානයක ප්‍රමුල ක්‍රියාකාරී පුද්ගලයෙකු විය යුතුය ;
තවද ;

(ඇ) ඉන් එක් තැනැත්තකු වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හෝ එම කාර්යභාරය දරන නිලධාරියා විය යුතුය ;

(ඈ) වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා හෝ එම කාර්යභාරය දරන අදාළ නිලධාරියා පළාත් අධිකාරියේ සභාපතිවරයා වන්නේ ය ;

(ඉ) පළාත් අධිකාරියේ සභාපතිවරයා විසින් එහි ලේකම්වරයා වශයෙන් වයඹ පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්වරයා හෝ ඔහුගේ කාර්යභාරය දරන නිලධාරියා පත්කළ යුතු ය.

පළාත් අධිකාරියේ මුද්‍රාව.

04. (1) පළාත් අධිකාරියේ මුද්‍රාව එහි ලේකම්වරයා භාරයේ තිබිය යුතුය.

(2) පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට පළාත් අධිකාරියේ මුද්‍රාව සකස් කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(3) පළාත් අධිකාරියේ සභාපතිවරයා හෝ සාමාජිකයකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට පළාත් අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් සභාපතිවරයා හෝ පැමිණ සිටි සාමාජිකයා විසින් එකී සටහන් පත්‍රයේ හෝ ලේඛනයේ තම අත්සන තැබිය යුතුය.

පළාත් අධිකාරියේ අරමුදල.

05. (1) පළාත් අධිකාරියට, අධිකාරිය සතු අරමුදලක් තිබිය යුතුය.

එම අරමුදලට —

(අ) වයඹ පළාත් සභාව විසින් පාරිසරික කාර්යයන් සඳහා සම්මත කරනු ලබන හෝ පවරා දෙනු ලබන සියළුම මුදල්.

(ආ) පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් අධිකාරිය වෙත ලැබෙන සියළුම මුදල්.

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ මධ්‍යම ආණ්ඩුවේ අනුමැතිය මත ශ්‍රී ලංකාවෙන් බැහැර තවර හෝ ප්‍රභවයන්ගෙන් ණය, පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියළුම මුදල් ; සහ

(ඈ) පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී දඩ වශයෙන් හෝ ගාස්තු වශයෙන් අයකර ගනු ලබන සියළුම මුදල් බැර කරනු ලැබිය යුතුය.

(2) පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් අධිකාරිය විසින් දැරිය යුතු යම් වියදමක් හෝ ගෙවීමක් පළාත් අධිකාරියේ අරමුදලින් දැරිය යුතුය.

(3) පළාත් අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දශලක්ෂයක් විය යුතු අතර, එය වයඹ පළාත් සභා අරමුදලින් පළාත් අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය.

පළාත් අධිකාරියේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

06. (1) පළාත් අධිකාරියේ මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතුය.

(2) පළාත් අධිකාරිය විසින් අධිකාරියේ ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියළු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතුය.

(3) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම පළාත් අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතුය.

(4) පළාත් අධිකාරියේ ගිණුම් විගණනය කිරීමෙන් අනතුරුව විගණකාධිපති හෝ ඔහු වෙනුවෙන් වයඹ පළාතට අදාළ රාජ්‍ය නිලධාරියා විසින් වයඹ පළාත් සභාව වෙත සෑම ලින් වර්ෂයක් අවසානයේදී නිරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

උපදේශක සභාව.

07. (1) මෙහි මින් මතු " උපදේශක සභාව " වශයෙන් හඳුන්වනු ලබන්නා වූ පළාත් පාරිසරික උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන අයගෙන් හෝ ඒ අය අතුරින් පත්කරනු ලබන යම් සාමාජික සංඛ්‍යාවකින් එය සමන්විත විය යුතුය :

(අ) පළාත් සභාවේ ඒ ඒ පළාත් අමාත්‍යාංශවල ලේකම් හෝ එම පළාත් අමාත්‍යාංශයේ අදාළ පළාත් ඇමතිවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ වෙනත් යම් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් බැගින්.
(ආ) වයඹ පළාත් සභාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඇ) වයඹ පළාත් සභාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධරයා.
(ඈ) වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඉ) වයඹ පළාත් සභාවේ ගොවිජන සේවා අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඊ) වයඹ පළාතේ මහාමාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(උ) වයඹ පළාතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වන සංරක්ෂණ නිලධාරියා හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඌ) වයඹ පළාත් සභාවේ කර්මාන්ත අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(එ) වයඹ පළාත් සභාවේ ධීවර අධ්‍යක්ෂ හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඒ) මධ්‍යම රජයේ එකඟත්වය අනුව පත්කර ගනු ලබන වයඹ පළාතේ නිවාස අධිකාරියේ පළාත් කළමනාකරු හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.
(ඔ) වයඹ පළාත් සභාවේ ඉඩම් කොමසාරිස්වරයා හෝ එම කාර්යභාරය ඉටු කරන නිලධාරියා.

(ඩ) පරිසර විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෙනත් පළාත් සභාවට අදාළ නිලධාරීන්.

(ත) පරිසර විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් මධ්‍යම රජයේ එකඟතාවය ඇතිව පත්කරනු ලබන වයඹ පළාතට අදාළව ක්‍රියාකරන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්, ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු, ජල සම්පාදන මණ්ඩලයේ වයඹ පළාතට අදාළව ක්‍රියා කරන ප්‍රධාන නිලධාරියා, වන සත්ත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වයඹ පළාතට අදාළව ක්‍රියා කරනු ලබන ප්‍රධාන නිලධාරියා, විදුලිබල මණ්ඩලයේ වයඹ පළාතට අදාළව ක්‍රියාකරනු ලබන ප්‍රධාන නිලධාරියා, නගර හා ග්‍රාම නිර්මාන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක්, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙක්.

(ථ) පරිසර ක්ෂේත්‍රයේ ස්වේච්ඡා සංවිධාන නියෝජනය කිරීම සඳහා සුදුසු පුද්ගලයන් තිදෙනෙක්.

(ද) පරිසර ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් විශේෂඥතාවයක් ඇති තිදෙනෙක්.

(ධ) පළාත් අධිකාරියේ තත්කාලීන ලේකම්වරයා.

(2) පළමු වැනි උප වගන්තිය යටතේ පත් කරනු ලබන යම් රාජ්‍ය නිලධාරියෙකු අයත්වන්නේ නම් පළාත් අමාත්‍යාංශයකට ද, එම අමාත්‍යාංශයේ අදාළ පළාත් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇත්නම් මිස එවැනි යම් නිලධාරියෙකු උපදේශක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුතුය.

(3) පළමුවැනි උප වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයින්ගෙන් යම් සාමාජිකයෙකු විෂයභාර අමාත්‍යවරයා විසින් උපදේශක සභාවේ සභාපති ලෙස පත්කළ යුතුය.

(4) උපදේශක සභාවේ ලේකම් ලෙස පළාත් අධිකාරියේ ලේකම්වරයාම ක්‍රියා කළ යුතුය.

(5) උපදේශක සභාවේ කර්තව්‍ය :

පළාත් අධිකාරියේ වගකීම්, බලතල සහ කාර්යයන් සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳව පළාත් අධිකාරියට සාමාන්‍ය උපදෙස් දීම සහ පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව විමර්ශණය කර, පළාත් අධිකාරියට වාර්තා කිරීම සහ ඒ පිළිබඳ අවශ්‍ය නිර්දේශ, උපදේශ ඉදිරිපත් කිරීම විය යුතුය.

පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ සාමාජිකත්වයට නුසුදුසුකම් ආදිය.

08. (1) යම් තැනැත්තෙක් —

(අ) පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවේ හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ සභිකයෙකු වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවේ නම් හෝ පුරවැසියෙකුව සිටීම අවශ්‍ය වුවහොත් ; හෝ

(ඇ) විෂයභාර අමාත්‍යවරයා විසින් හෝ අදාළ පරිදි ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ඈ) සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හේතුකාරක වූ තමාට අදාළ නිල රාජකාරිය, ස්ථාන මාරුවක් හෝ වෙනයම් හේතුවක් නිසා වෙනස් වුවහොත්, ඔහු පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කරනු ලැබීම සඳහා හෝ තවදුරටත් සාමාජිකයෙකු ලෙස සිටීම සඳහා හෝ නුසුදුස්සෙකු වන්නේය.

(2) 03(1) වගන්තිය යටතේ පළාත් අධිකාරියට හෝ 07(1) වගන්තිය යටතේ උපදේශක සභාවට පත් කරන ලද යම් සාමාජිකයෙකුගේ සාමාජික කාලය 08(1) වගන්තිය යටතේ නුසුදුස්සෙකු නොවුවහොත් පත් කළ දින සිට වර්ෂ 03 කාලයකට වලංගු විය යුතුය.

(3) යම් සාමාජිකයෙකු පත් කිරීමෙන් අනතුරුව වර්ෂ තුනක් ඉකුත්වීමට පෙරාතුව 08(1) වගන්තියෙන් නුසුදුස්සෙකු වුවහොත් ඔහු වර්ෂ 03 සපිරීම කෙක් වූ කාලය සම්පූර්ණ වනතෙක් පමණක් බලපැවැත්වෙන පරිදි ඔහු වෙනුවෙන් අදාළ පරිදි 03(1) වගන්තියෙන් හෝ 07(1) වගන්තියේ සඳහන් අය අතරින් වෙනත් අයෙකු අදාළ පරිදි ප්‍රධාන අමාත්‍යවරයා විසින් හෝ විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

(4) යම් සාමාජිකයෙකු හෝ සාමාජික පිරිසක් හෝ නිල කාලය අවසන් වූ පමණින් යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ කාර්යයන් බාධාවක් හෝ ඵල රහිතවීමක් සිදුනොවිය යුතු අතර, එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

(5) පළාත් අධිකාරියේ සහ උපදේශක සභාවේ ලේකම්වරයාගේ හා පළාත් අධිකාරියේ සභාපතිවරයාගේ ධූරකාලය ඔහු සිය නිල තනතුරෙහි සිටින තාක් කල් බලපැවැත්වෙනු ඇත.

(6) දිවයිනෙන් බැහැරවීම හෝ රෝගාතුරවීම හෝ වෙනයම් හේතුවක් මත පළාත් අධිකාරියේ සහ උපදේශක සභාවේ ලේකම්වරයාට හෝ පළාත් අධිකාරියේ සභාපතිවරයාට එම ධූරයෙහි සේවය කිරීමට නොහැකිවන අවස්ථාවක අදාළ පරිදි ප්‍රධාන අමාත්‍යවරයා හෝ විෂය භාර අමාත්‍යවරයා විසින් තාවකාලිකව එම ධූරයට අදාළ නිල තනතුරෙහි ඊළඟ ජ්‍යෙෂ්ඨ නිලධාරියා හෝ වැඩ බලන නිලධාරියා හෝ පත් කළ හැකි ය.

(7) පළාත් අධිකාරියේ සභාපති හෝ පළාත් අධිකාරියේ සහ උපදේශක සභාවේ ලේකම් හෝ තමා පත්කිරීමට අදාළ වූ යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියකු හෝ නොවන යම් සාමාජිකයෙකුට අදාළ පරිදි ප්‍රධාන අමාත්‍යවරයා වෙත හෝ විෂයභාර අමාත්‍යවරයා වෙත ලිඛිතව දැනුම්දීමක් කර ඉල්ලා අස්විය හැකි ය.

(8) පළාත් අධිකාරියේ සභාපතිවරයාට, ලේකම්වරයාට හෝ සාමාජිකයින්ට ද උපදේශක සභාවේ සාමාජිකයින්ටද විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් හෝ පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(9) පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ සභාපති පැමිණ සිටින විට ඔහු විසින් අදාළ පරිදි පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ සියළු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. එවැනි රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට සාමාජිකයින් අතරින් කෙනෙකු සාමාජිකයින් විසින් තෝරා ගනු ලැබ මුලසුන දැරිය යුතුය.

(10) පළාත් අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකු විය යුතු අතර, උපදේශක සභාවේ ගණපූරණය සාමාජිකයින් 05 දෙනෙකු විය යුතුය.

(11) පළාත් අධිකාරියේ හෝ උපදේශක සභාවේ රැස්වීම්, සභාපතිවරයා විසින් නියම කරනු ලබන දිනයන්හි හා වේලාවන්හිදී හා නියම කරනු ලබන ස්ථානයකදී පැවැත්විය යුතුය.

(12) පළාත් අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන අමාත්‍යවරයා හෝ විෂයභාර අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන විධි විධානවලට අනුකූලව ක්‍රියාකළ යුතුය.

## II වැනි කොටස

### පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන්

පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන්.

09. පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන් පහත දැක්වෙන ඒවා විය යුතුය.

(අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම.

(ආ) පළාත් සීමා තුළ පාරිසරික සංරක්ෂණය සඳහා අවශ්‍ය පස සංරක්ෂණය, වන සංරක්ෂණය, වායු, ජල, ගොඩබිම දූෂණය වළක්වාලීම සඳහා අවශ්‍ය ක්‍රම සම්පාදනය, වායු, ජල, ගොඩබිම පරිහරණය කිරීමේ දී සංරක්ෂණය කර, ආරක්ෂා කළයුතු වායු, ජල, ගොඩබිම් සීමාවන් වෙන්කර සැළසුම් සම්පාදනය යන කරුණු පිළිබඳව අවශ්‍ය වන්නා වූ සංශෝධන හෝ රීති සැකසීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් අනුව අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන හෝ රීති සකස්කර ඉදිරිපත් කිරීම.

(ඇ) පරිසර දූෂණය ඇතිවීමේ හේතූන් හා එහි ස්වභාවය, ප්‍රමාණය හා එය වැළැක්වීමට ගතයුතු පියවර සම්බන්ධයෙන් සමීක්ෂණය හා විමර්ශණ පැවැත්වීම හෝ ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමීක්ෂණ හෝ විමර්ශණ මණ්ඩල පත්කිරීම සහ පළාත් අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමෙහි ලා සහය විය හැකි විශේෂ කමිටු පත් කිරීම.

(ඈ) පරිසරය වඩා වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම සහ ආරක්ෂා කර ගැනීම සඳහා ද, එම තත්ත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන්, උපමානයන් සහ නියමයන් නිශ්චය කිරීම හා නියම කිරීම.

(ඉ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා අදාළ පොත්පත්, ලිපිලේඛන, වාර්තා තොරතුරු සහ දැන්වීම් ආදිය ප්‍රකාශයට පත් කිරීම.

(ඊ) මෙම වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව ක්‍රියාකරන බවට වගබලා ගැනීම සඳහා විමර්ශන, පරීක්ෂණ පැවැත්වීම සහ එම විධිවිධාන උල්ලංඝණය කර ඇති බවට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශණ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉහත කී "ඊ" අකුරු වගන්තිය යටතේ විමර්ශන පරීක්ෂණ පැවැත්වීම සඳහා යොදගත යුතු ක්‍රම විධිවිධාන තීරණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පුද්ගලයන්, නිලධාරීන් හෝ පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් අයෙකු යෙදවීම.

(ඌ) පරිසරය ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනයාට තොරතුරු හා අධ්‍යාපනය ලබාදීම.

(එ) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් වෙනත් දේශීය හෝ ජාත්‍යන්තර සංවිධාන සමඟ සම්බන්ධතා ඇති කිරීම, පවත්වාගෙන යාම සහ අධ්‍යාපනික හුවමාරු වැඩ සටහන් ඇති කර ගැනීම.

(ඒ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා දීර්ඝකාලීන හෝ කෙටි කාලීන හෝ සැලසුම් සකස් කිරීම සහ පරිසර සංරක්ෂණය සඳහා මහජනයා හෝ ආයතන දිරිගැන්වීම සඳහා අවශ්‍ය කාර්ය පරිපාටි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඔ) පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීම වැළැක්වීමට ද, පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීමට ද, අදාළ සියළු කටයුතු සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඕ) වයඹ පළාත් සීමාව තුළ යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ, ක්‍රියාත්මක කරන ලෙස එම පළාත් පාලන ආයතනයට නියම කිරීම සහ පහත සඳහන් අංශ සියල්ල හෝ ඒ අතුරෙන් යම් අංශයක් සම්බන්ධයෙන් හෝ යම් නිර්දේශ අනුව ක්‍රියාත්මක කරන ලෙස හා ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස අදාළ පළාත් පාලන අංශයට නියම කිරීම :–

(i) කුණුකසල, මළමූත්‍ර හෝ වෙනත් අපද්‍රව්‍ය අනවසරයෙන් බැහැර කිරීම, පිට කිරීම හෝ තැන්පත් කිරීම හා එම කාර්ය කළමනාකරණ නියමයන් පැනවීම.

(ii) පස, වාතය, ඇල මාර්ග හෝ ජල මාර්ග කරා, පවිත්‍ර නොකළ මළමූත්‍ර, කැළිකසල, වෙනත් අපද්‍රව්‍ය හෝ කාර්මික හෝ කෘෂිකාර්මික විෂ රසායනික ද්‍රව්‍ය හෝ සාමතික ධූමය හෝ පරිසරයට හා මහජන සෞඛ්‍යයට අහිතකර වූ අපද්‍රව්‍ය අංශු සහිත වායු හෝ ධූමය හෝ බැහැර කිරීම හෝ පිටවීම ඉඩ සැලසීම වැළැක්වීම සහ තහනම් කිරීම හා එම කාර්යය කළමනාකරණ නියමයන් පැනවීම.

(iii) බිත්තිවල හෝ ගොඩනැගිලිවල හෝ වෙනත් යම් අවසර නොලත් ස්ථානවල හෝ මහාමාර්ගයේ හෝ දැන්වීම්, පත්‍රිකා ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම සහ ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීමේ කාර්යය විධිමත් කිරීම.

(iv) දර්ශණීය ස්ථාන, රජයේ දේපල, ඓතිහාසික තවබුන් විරූප කිරීම වැළැක්වීම.

(v) වායු, ශබ්ද හා භෞමික දූෂණය පාලනය කිරීම හා එම කාර්යය කළමනාකරණ නියමයන් පැනවීම.

(vi) සෞඛ්‍යයට සහ පරිසරයට උපද්‍රවකාරී යම් ද්‍රව්‍යයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම තහනම් කිරීම හෝ ඒ සඳහා අවශ්‍ය නියමයන් කිරීම.

(vii) මාර්ග දෙපස හෝ උද්‍යානවල හෝ රුක්ගොමුවල හෝ වෙනත් පොදු ස්ථානවල රෝපණය කළ හෝ රෝපණය වී ඇති පැල සහ වෘක්ෂවලට හානි කිරීම වැළැක්වීම සහ එම පැල සහ වෘක්ෂ ආරක්ෂා කිරීම සහ අලංකාර ලෙස පවත්වාගෙන යාම සඳහා විධිවිධාන යෙදීම සහ ආරක්ෂා කිරීම සඳහා දිරිගැන්වීම් වශයෙන් ඉදිරිපත් කරන නිර්දේශ හෝ යෝජනා ක්‍රියාත්මක කිරීම හා* එම කාර්යය කළමනාකරණ නියමයන් පැනවීම.

10. (1) පළාත් අධිකාරිය විසින් යම් පළාත් පාලන ආයතනයක සීමා ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම, රැකගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යයි පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම්කිසි ක්‍රියාවක් හෝ දෙයක් කරන ලෙසට හෝ කරනු ලැබීමට සලස්වන ලෙසට විශේෂ හෝ පොදු සංවිධාන ලිඛිතව නිකුත් කළ හැකිය.

පළාත් පාලන ආයතනවලට විධානදීමට ඇති බලය.

(2) එබඳු යම් විධානයක් දෙනු ලැබූ විට අදාළ පළාත් පාලන ආයතනය විසින් එම විධිවිධානය අනුව ක්‍රියා කළ යුතුය.

## III වැනි කොටස

### පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලය

11. (1) අංක 03 (1) (ඇ) වගන්තිය අනුව පත්කරන ලද සභාපතිවරයා පළාත් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, අංක 03 (1) (ඉ) වගන්තිය යටතේ පත් කරන ලද ලේකම්වරයා පළාත් අධිකාරියේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුතුය.

පළාත් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන පරිපාලන නිලධාරියා.

(2) (අ) පළාත් අධිකාරියේ කටයුතු මෙහෙයවීම, පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම ද, පළාත් අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනය හා පාලනය ද, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව පළාත් අධිකාරියේ ලේකම්වරයා වෙත භාරවිය යුතුය.

(ආ) එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ලේකම්වරයාට සහාය වශයෙන් පළාත් අධිකාරිය විසින් 12 (1) වගන්තියෙන් නියම කරනු ලබන සුදුසුකම් හා සේවා කොන්දේසි මත පාරිසරික කටයුතු පිළිබඳ මහා නිපුණත්වයක් පාරිසරික විෂය පිළිබඳ අධ්‍යාපනික සුදුසුකම් ඇති අයෙකු පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ ලෙස පළාත් අධිකාරිය විසින් බඳවා ගත යුතුය.

(ඇ) ඒ සඳහා පළාත් අධිකාරිය විසින් 12 (2) වගන්තිය යටතේ නියම කරනු ලබන සුදුසු පාරිශ්‍රමිකයන් ඔහුට ගෙවනු ලැබිය යුතුය.

(ඈ) පළාත් අධිකාරියේ ලේකම්වරයාට හෝ ඔහු නොමැතිවිට අධ්‍යක්ෂවරයාට පළාත් අධිකාරියේ රැස්වීම්වලට සහභාගිවීමේ හිමිකම ඇති නමුත් එහි රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකමක් ඔහුට නොවිය යුතුය.

12. (1) කාර්යක්ෂම ලෙස පළාත් අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි පළාත් අධිකාරිය විසින් තීරණය කරනු ලබන සේවකයින් හා නිලධාරීන් අධිකාරිය විසින් නියම කරනු ලබන බඳවා ගැනීමේ කාර්ය පරිපාටියට අනුකූලව පත්කරනු ලැබිය හැකිය.

වෙනත් නිලධාරීන්, නිලධාරීන්ගේ හා සේවකයන් සහ අනුයෝජිතයන් පත් කිරීම.

(2) පළාත් අධිකාරිය විසින් නියම කරනු ලබන නියෝග මගින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ එසේම නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව 08(8) වගන්තිය යටතේ තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් හෝ දීමනාවන්ට අදාළ නොවන සෙසු නිලධාරීන්ට හෝ සේවකයින්ට පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබිය යුතුය.

(3) පළාත් අධිකාරියේ ඉල්ලීම පිට රජයේ පළාත් පාලන හෝ පළාත් සභා සේවකයින් හෝ රාජ්‍ය අනුබද්ධිත ආයතනයක හෝ සේවයේ නියුක්ත යම් සේවකයකු හෝ නිලධාරියකු එම සේවකයාගේ කැමැත්ත හා එම සේවකයාට අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ අදාළ වන පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය හෝ මුදා හැරීම මත පළාත් අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව හෝ පළාත් අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයට හෝ පත් කරනු ලැබිය හැකිය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

(4) ඉහත (3) වැනි උප වගන්තිය යටතේ තාවකාලිකව පත්කරගනු ලබන නිලධාරීන් හෝ සේවකයින් සඳහා ජාතික රාජ්‍ය සභාව 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වැනි වගන්තියේ (2) උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(5) නිශ්චිත කාලයක් පළාත් සභාවේ සේවය කිරීමට ගිවිසුමකින් බැඳී ඇති පළාත් සභාවේ යම් සේවකයකු පළාත් අධිකාරියේ සේවය කිරීමට බඳවා ගනු ලැබූ/අනුයුක්ත කර ගනු ලැබූ අවස්ථාවක පළාත් අධිකාරියේ සේවය කරන යම් කාලයක් ද, පළාත් සභාවේ එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමට සේවය කරනු ලැබූ කාලයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(6) පළාත් අධිකාරියේ සේවයට තාවකාලිකව පත්කරනු ලැබූ සේවකයින් ද, පළාත් අධිකාරියේ විනය පරිපාලනයට යටත් විය යුතුය.

(7) පළාත් අධිකාරියේ සේවකයින් හා නිලධාරීන් බඳවා ගැනීමේ දී පළාත් අධිකාරිය විසින් නියම කරනු ලබන නියෝග මගින් කරනු ලබන සුදුසුකම් හා සේවා කොන්දේසි පළාත් අධිකාරියේ සභාපති හා ලේකම් හැර සෙසු සියළු නිලධාරීන් හා සේවකයින්ට අදාළ විය යුතුය.

*IV වැනි කොටස*

**පාරිසරික කළමනාකරණය**

ඉඩම් උපයෝගී කර ගැනීමේ කළමණාකරණය.

13. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා ඉඩම් විෂය භාර පළාත් අමාත්‍යවරයාගේ සහාය ඇතිව පළාත් සභා සීමාව තුළ ඉඩම් මනාව උපයෝගී කර ගැනීමේ ක්‍රමයක් පහත දක්වෙන පරමාර්ථවලට ගැලපෙන පරිදි සකස් කිරීම සහ විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම කළ යුතුය :–

(අ) ඉඩම්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීම පිණිස ඉඩම් සහ ඒවායේ සම්පත් මලකර ලබාගැනීම, උපයෝගී කර ගැනීම හා මැහැර කිරීම සඳහා ක්‍රමානුකූල හා කාර්යක්ෂම සැලැස්මක් සකස් කිරීම.

(ආ) මුඩු ඉඩම්, වගා නොකළ ඉඩම් අතහැර දමා හෝ නොසලකා හැර ඇති ඉඩම් සහ මනා පැවැත්මක් ඇතිව හෝ වඩා ප්‍රයෝජනවත් ලෙස වගා නොකළ ඉඩම් සම්බන්ධයෙන් කොන්දේසි හෝ නියෝග පැනවීම.

(ඇ) පළාත් අවශ්‍යතාවයන් සහ ඉඩම් සම්පත් අතර අසමබරතාවයක් ඇතිවීම වැළැක්වීම පිණිස ඒ සම්පත් වඩා ක්‍රමවත් ලෙස උපයෝගී කර ගැනීම සහ සංරක්ෂණය කිරීම.

(ඈ) ඒ ඒ ඉඩම්වල, ගම්මාන හෝ ප්‍රදේශවල වගා කළයුතු භවභෝග නියම කිරීම.

ඉඩම් උපයෝගී කර ගැනීමේ ක්‍රමය.

14. 13 වැනි වගන්තිය යටතේ සම්පාදික ඉඩම් උපයෝගී කර ගැනීමේ ක්‍රමයට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

(අ) විද්‍යානුකූල ඉඩම් වර්ගීකරණය ක්‍රමය සහ ඉඩම් වර්ගීකරණ ලැයිස්තුවක්.

(ආ) වර්තමාන ඉඩම් උපයෝගී කරගැනීම, එම ඉඩම් ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රමාණය, ඌණ ප්‍රයෝජනයට ගෙන ඇති ප්‍රමාණය, නිශ්ක්‍රීය නැතහොත් අතහැර දමා ඇති ප්‍රමාණය.

(ඇ) ප්‍රජා සංවර්ධනයට, කෘෂිකර්මයට, කාර්මික කටයුතුවලට, වාණිජ කටයුතුවලට සහ පදිංචියට ඉඩම් යොද ගැනීමේ හැකියාව පිළිබඳ නිවැරදිව හා සවිස්තරව තීරණය කිරීම.

(ඈ) පාලනයෙන් තොරව සංවර්ධන කටයුතුවලට හා වෙනත් කායර්යන් සඳහා යොද ගැනීමේදී හානි සිදුවිය හැකි වැදගත් ඓතිහාසික, සංස්කෘතික, සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති හෝ එම ඉඩම් සංවර්ධනය කිරීමෙන් පරිසර සංරක්ෂණයට හානි පැමිණවිය හැකි ඉඩම් හා ප්‍රදේශ හඳුනා ගැනීම.

(ඉ) පාරිසරික පාලනය අවශ්‍ය යයි සළකනු ලැබිය හැකි ප්‍රදේශවල ඉඩම් උපයෝගී කර ගැනීම පළාත් සභාව විසින් පාලනය කරනු ලැබීම සඳහා ක්‍රමයක්.

(ඊ) පුද්ගලයන් පදිංචි කිරීම සහ ගම් පුළුල් කිරීම සඳහා අළුත් ප්‍රදේශ තෝරාගැනීමට සහ ඒ ප්‍රදේශ තුළ හා ඒ අවට ඉඩම් උපයෝගී කර ගැනීම පිළිබඳව උචිත පාලන විධි තහවුරු කිරීම සඳහා වූ ක්‍රම කෙරෙහි බලපාන ප්‍රතිපත්තියක්.

*ස්වභාවික සම්පත්*

ස්වභාවික සම්පත් කළමණාකරණය සහ සංරක්ෂණය.

15. පළාතේ ස්වභාවික සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම පිණිස සහ ඒවා අනාගත පරම්පරාවලට ආරක්ෂාකර තැබීම පිණිස එම ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා මූලික ප්‍රතිපත්තියක් සහ ඒ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම පිණිස වූ පොදු ක්‍රියාමාර්ග පිළිබඳවද පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාද ඉදිරිපත් කළ යුතුය.

ධීවර සහ ජලජ සම්පත්

*ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය*

16. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා වයඹ පළාත් සභා සීමාවට ඇතුළත් සමුද්‍ර ජල තීරයෙහි හෝ අභ්‍යන්තර ජලයෙහි ධීවර සහ ජලජ සම්පත් විධිමත්ව හා උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාදා ඉදිරිපත් කළ යුතුය.

වන සත්ත්ව සම්පත්

*වන සත්ත්ව සම්පත් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්තිය.*

17. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා වයඹ පළාතේ වන සත්ත්ව සම්පත් ක්‍රමවත්ව ප්‍රයෝජනයට ගැනීමේ සහ සංරක්ෂණය කිරීමේ ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් මත නියෝග සාදා ඉදිරිපත් කළ යුතුය.

වන සම්පත්

*වන සම්පත් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්තිය.*

18. පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා සකස් කරනු ලබන —

(i) වන සම්පත් විධිමත්ව ප්‍රයෝජනයට ගැනීමේ ;

(ii) වඳවී යාමට භාජනය වී ඇති හෝ ආරක්ෂා කළයුතු වූ වන සම්පත් ආරක්ෂා කිරීමේ, සංවර්ධනය කිරීමේ, නැවත වගා කිරීමේ සහ එම සම්පත් විනාශ කිරීම්, අළෙවි කිරීම් සීමා කිරීමේ සහ තහනම් කිරීමේ ;

(iii) වන සංරක්ෂණය හා රුක් රෝපණය සඳහා මහජන සහභාගිත්වය ලබාගැනීමේ සහ දිරිමත් කිරීමේ ;

(iv) ඉඩම් වර්ගීකරණය කිරීම, වන ව්‍යාපෘතිය කළමණාකරණය කිරීම, කාර්මික වටිනාකමකින් යුක්ත සහ ඉන්ධන දව වටිනාකමකින් යුක්ත වෘක්ෂ වගා කිරීම, උද්‍යාන සහ වන සත්ත්ව කළමණාකරණය කිරීම, වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම, සංවර්ධන කාර්යයන්හි දී වන හානි සීමා කිරීම සහ අවම හානියක් සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම, මාර්ග දෙපස රුක් රෝපණය කිරීම සහ එම රුක් රෝපණ කටයුතු විධිමත් කිරීම, වනෝද්‍යාන, රුක් ගොමු, වන ආශ්‍රිත විවේක ස්ථාන පිහිටුවීම, සංවර්ධන හා සංරක්ෂණය කිරීමේ ;

ක්‍රමයක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂයභාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි නියෝග සාදා ඉදිරිපත් කළ යුතුය.

පස සංරක්ෂණය

*පස සංරක්ෂණය කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්තිය.*

19. වාරිමාර්ග, කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත හා ඉඩම්, මහාමාර්ග සහ පළාත් පාලන විෂයභාර පළාත් අමාත්‍යාංශවල සහාය ඇතිව පළාත් අධිකාරිය විසින් උපදේශක සභාවේ අදහස් විමසා අවදානම් සහිත දිය බස්නා ප්‍රදේශ හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, පාංශු ඛාදනය සීමා කෙරෙන හා විද්‍යාත්මක ගොවිතැන් විධි හඳුනාගැනීම, අධ්‍යයනය කිරීම සහ හඳුන්වාදීම, පාංශු ඛාදනයට ලක්වන භූමි ප්‍රදේශ හඳුනාගැනීම, සංරක්ෂණය කිරීම, පාංශු ඛාදනයට හේතුවන වගාවන් හෝ වෙනත් ක්‍රියාවන් සීමාකිරීම, තහනම් කිරීම සහ කොන්දේසි පැනවීම, පස සංරක්ෂණය සඳහා දිරිගැන්වීම සහ පාංශු ඛාදනයෙන් වන හානි හඳුන්වාදීම, මහාමාර්ගවල හා ඉඩම්වල ජල බස්නා ක්‍රම විධිමත් කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳ වැඩ සටහනක් විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය. ඒ අනුව විෂය භාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි නියෝග සාදා ඉදිරිපත් කළ යුතුය.

V වැනි කොටස

**පාරිසරික ආරක්ෂාව**

*අප ද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම.*

20. (1) මෙහි මින් මතු " අදාළ දිනය " වශයෙන් සඳහන් කරනු ලබන විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි කවර හෝ තැනැත්තකු විසින් —

(අ) පළාත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ ; සහ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට, උපමානවලට, කොන්දේසි සහ නියෝගවලට අනුකූලව හැර,

පරිසරය දූෂණය විය හැකි අපද්‍රව්‍ය, එනම් කුනු කසල, සත්ත්ව හෝ ශාක කොටස්, මළමූත්‍ර, කාර්මික හෝ කෘෂිකාර්මික විෂ, රසායන ද්‍රව්‍ය, කාමනික ද්‍රව්‍ය හෝ පරිසරයට සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාවට අහිතකරවූ අපද්‍රව්‍ය අංශු සහිත හෝ අප්‍රසන්න ගන්ධයකින් යුතු වායු හෝ ධූමය බැහැර කිරීම, පිට කිරීම හෝ බැහැරවීමට, පිටවීමට ඉඩ සැලසීම නොකළ යුතුය.

*බලපත්‍ර නිකුත් කිරීම.*

21. (1) පළාත් අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක ඒ සඳහා පළාත් අධිකාරිය වෙත කරනු ලබන යම් ඉල්ලීමක් මත සහ පළාත් අධිකාරිය වෙත නියමිත ගාස්තුව ගෙවීම මත මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හා උපමානවලට, කොන්දේසි හා නියෝගවලට අනුකූලව 20 වැනි වගන්තිය ප්‍රකාශිත, අපද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය වායු හෝ ධූමයන් පරිසරය වෙත බැහැර කිරීමට හෝ පිට කිරීමට පරිසරයෙහි තැන්පත් කිරීමට යම් තැනැත්තකුට හෝ යම් ආයතනයකට හෝ බලය පවරමින් තාවකාලික හෝ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය.

(2) එම බලපත්‍රය වලංගු කාලය නිශ්චිතව එහි සඳහන් විය යුතු අතර, එකවර ලින් වර්ෂයක් ඉක්මවා බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(3) (1) වැනි උප වගන්තිය අනුව යම් කාර්යයක් සඳහා යම් බලපත්‍රයක් නිකුත් කළ පසු එම කාර්යය බලපත්‍රයේ කාලසීමාව ඉක්මවා තවදුරටත් පවත්වාගෙන යා හැකි වන්නේ අළුතින් බලපත්‍රයක් ලබාගැනීම හෝ අළුත්කර ගැනීමෙන් පසුව පමණක් විය යුතුය.

බලපත්‍රයක් සම්බන්ධව අදාළ අමාත්‍යාංශයකින් දෙපාර්තමේන්තුවකින් හෝ ආයතනයකින් වාර්තා ලබා ගැනීම.

22. (අ) 21 වැනි වගන්තියට අනුකූලව බලපත්‍රයක් නිකුත් කිරීමේ දී, අදාළ කාරණය සම්බන්ධයෙන් යම් පළාත් අමාත්‍යාංශයකින්, දෙපාර්තමේන්තුවකින් හෝ ආයතනයකින් හෝ යම් නිලධාරියෙකුගෙන් වාර්තාවක් හෝ නිර්දේශ ලබාගත යුතු යයි පළාත් අධිකාරිය අදහස් කරනු ලබන්නේ නම් එම ඉල්ලීම පිළිබඳව වාර්තාවක් හෝ නිර්දේශයක් සපයන ලෙසට යම් පළාත් අමාත්‍යාංශයකට, දෙපාර්තමේන්තුවකට හෝ ආයතනයකට හෝ යම් නිලධාරියෙකුට යොමු කරනු ලැබිය හැකිය.

(ආ) එසේ යොමු කරනු ලැබූ කාරණය සම්බන්ධයෙන් අප්‍රමාදව අදාළ පළාත් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ ආයතනය විසින් වාර්තාව හෝ නිර්දේශය පළාත් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) එම වාර්තාව හෝ නිර්දේශය ලැබෙන තෙක් පළාත් අධිකාරිය විසින් අදාළ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් නොගත යුතුය.

..ු අත්හිටුවීමට හෝ අවලංගු කිරීම.

23. (අ) අංක 21 වැනි වගන්තිය යටතේ යම් බලපත්‍රයක් ලැබූ අයෙකු පළාත් අධිකාරිය විසින් නියම කරන ( කොන්දේසි හෝ නියමයන් හෝ බලපත්‍රයෙහි සඳහන් විධිවිධාන කිසිවක් උල්ලංඝණයකර, නොසලකා හැර ඇති අවස්ථාවක හෝ අපද්‍රව්‍ය පිටකරනු ලබන හෝ තැන්පත් කරනු ලබන, පරිසරය අපද්‍රව්‍ය පිට කරනු ලැබීමට, තැන්පත් කරනු ලැබීමට තවදුරටත් නුසුදුසු යයි හෝ නිෂ්ඵල යයි පළාත් අධිකාරිය විසින් තීරණය කරන ලද අවස්ථාවක එකී බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමට හෝ අවලංගු කිරීම හෝ කළ හැකිය.

(ආ) එසේ අත්හිටවූ හෝ අවලංගු කළ වහාම ඊට අදාළ ක්‍රියාව නතර කළ යුතුය.

බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කළ විට අභියාචනා ඉදිරිපත් කිරීම.

24. (1) (අ) පළාත් අධිකාරිය විසින් 21 වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් දීම ප්‍රතික්ෂේප කළහොත් ඒ බව අදාළ අයට දන්වුම් දිය යුතුය.

(ආ) එසේ දන්වුම්දීමෙන් අතෘප්තියට පත් අයෙකුට එකී දන්වුම් දීමේ දිනයේ සිට දින පහක් ඇතුළත විෂයභාර අමාත්‍යවරයා වෙත ලියාපදිංචි තැපැලෙන් එවන ලිපියක් මගින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) එබඳු අභියාචනයක් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් මගින් පරීක්ෂණයක් පවත්වා ලබා ගන්නා නිර්දේශයක් මත තීරණයක් දිය යුතුය.

(2) විෂයභාර අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

## VI වැනි කොටස

## පාරිසරික තත්ත්වය

දේශීය ජල . තීරය දූෂණය කිරීම ඩීමා කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම

25. මේ ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියට යටත්ව අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හෝ උපමානවලට අනුකූලව හැර කිසිම තැනැත්තකු විසින් වයඹ පළාතේ දේශීය ජල තීරය තුළ අපද්‍රව්‍ය තැන්පත් කිරීම හෝ ඒ තුළට පිටකිරීම හෝ නොකළ යුතුය.

දේශීය ජල තීරය දූෂණය කිරීම

26. (1) කිසිම තැනැත්තකු විසින්, වයඹ පළාතේ දේශීය ජල තීරයක් හෝ ඒ දේශීය ජල තීරයෙන් යම් කොටසක් හෝ අපවිත්‍රවීම, අහිතකරවීම, විෂවීම, අපිරිසිදුවීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට, සුඛසාධනයට, ආරක්ෂාවට හෝ දේපලවලට හානිකරවීම, සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, මත්ස්‍යයන්ට, ශාකවලට හෝ වෙනත් ආකාරයේ ජීවීන්ට විෂ සහිත වීම හෝ හානිදායකවීම, නැතහොත් ඒ ජල තීරය වැඩදායී ලෙස උපයෝගී කිරීමෙහි ලා හානිකරවීම් සිදුවන පරිදි හෝ එසේ සිදුවෙතැයි සාධාරණ ලෙස බලාපොරොත්තුවිය හැකි පරිදි ඒ ජල තීරයේ භෞතික, රසායනික හෝ ජෛව තත්ත්වය වෙනස්වන ආකාරයෙන් ඒ දේශීය ජල තීරය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එසේ දූෂණය කිරීමට සැලැස්වීමෙහිලා අවසරදීම නොකළ යුතුය.

(2) යම් තැනැත්තකු විසින් -

(අ) යම් ජල තීරයක හෝ යම් ජල තීරයක් මත හෝ යම් ජල තීරයක් වෙත ප්‍රවේශය ඇතිවිය හැකි ස්ථානයක මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ හෝ, ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් තහනම් කරනු ලැබූ සහ දියර හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් ;

(ආ) සණ දියර හෝ වායුමය වන්නා වූ යම් අපද්‍රව්‍ය යම් ජල තීරයක් තුළට හෝ වියළීම පවත්නා විටෙක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජල මාර්ගයක පත්ලට ඇද වැටීම, අවරෝහණය වීම, බැස යාම, වාෂ්පවීම, සෝදා ගෙන යාම, සුළඟට ගසාගෙන යාම, හෝ කාන්දු වීම සිදුවන ඉරියව්වක ස්ථාපනය කරනු ලැබුවහොත් ; හෝ එසේ ඇද වැටීමට, අවරෝහණය වීමට, බැසයාමට සුළඟට ගසාගෙන යාමට , වාෂ්ප වීමට, සෝදාගෙන යාමට හෝ කාන්දුවීමට ඉඩ ඇති ඉරියව්වක ස්ථාපනය කරනු ලැබුවහොත්, නැතහොත් දැනුවත්ව හෝ ස්වකීය නොසලකා හැරීම මගින් කෙළින්ම හෝ නොරසේම, එවැනි යම් ද්‍රව්‍යයක් එවැනි ඉරියව්වක ස්ථාපනය කිරීමට සැලැස්වුවහොත් හෝ එහිලා අවසර දුනහොත් ;

(ඇ) වියළිව පවත්නා විටක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජලමාර්ගයක පත්ලෙහි අපද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ දැනුවත්ව හෝ ස්වකීය නොසලකා හැරීම මගින්, එවැනි පත්ලක යම් අපද්‍රව්‍යයක් ස්ථාපනය කිරීමට සැලැස්වුවහොත් හෝ එහිලා අවසර දුනහොත් ; හෝ

(ඈ) වයඹ පළාතේ වෙරළබඩ හෝ අන් වෙරළ ජල තීරයේ උෂ්ණත්වය, නියමිත සීමාවට වඩා වැඩි කිරීම හෝ අඩු කිරීමට සලස්වනු ලැබුවහොත් -

(1) වැනි උප වගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි, ඔහු විසින් ඒ උප වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) (1) වැනි උප වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තෙකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී -

(අ) රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද, දඩයකට හෝ ඉන් අනතුරුව එම වරද දිගටම කරනු ලබන අවස්ථාවක එම වරද එසේ දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩයකට ද ඔහු යටත් විය යුතුය ; තවද

(ආ) අධිකරණය විසින් නියමය කරනු ලබනයම් කාලයක් ඇතුළත, වයඹ පළාතේ වෙරළබඩ සහ අන් වෙරළ ජල තීරයට තවදුරටත් හානි සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලෙස එවැනි නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලද බවට ප්‍රමාණවත් හා පිළිගත හැකි සාක්ෂි ඒ කාලය අවසානයේ දී ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කළ යුතුය. එම වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විටත් සිදුව ඇති හානිය නිරවද්‍ය කිරීමෙහි ලා අධිකාරිය විසින් දරනු ලැබිය හැකි වියදම් දරණ ලෙසද අධිකරණය විසින්, වරදකරු කරනු ලැබූ ඒ තැනැත්තාට නියම කළ යුතු අතර, එසේ දරණ ලද වියදම් දරීම, ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් පරිද්දෙන් ඒ වියදම් අයකර ගනු ලැබිය යුතුය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු විසින්, එහු වරදකරු කරනු ලැබූ දින සිට සති හයක කාලයකට පසුව ඒ වරද දිගටම කරගෙන යනු ලබන අවස්ථාවක තවදුරටත් හානි සිදු කිරීම වැළැක්වීමෙහි ලා ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් නිරවද්‍ය කිරීමේ පියවර ගනු ලබන නොත්, දේශීය ජල තීරය, වෙරළබඩ හෝ අන් වෙරළ ජල තීරය දූෂණය වීම සිදුකළ ඒ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා පළාත් අධිකාරියේ ලේකම්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයෙකු විසින් කරන ඉල්ලීමක් මත ඒ කර්මාන්ත ශාලාව, කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකිය.

(5) (4) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවක් අනුව ක්‍රියාකිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන කවර හෝ අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින්, ආඥාවක් මගින් ඒ ආඥාව නිකුත් කළ දිනයේ සිට පැහැදිලි දින තුනකට කලින් හෝ දින හතකට පසුව නොවිය යුතු ඒ ආඥාවේ සඳහන් දිනයට පෙර ඒ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙ[illegible] අධිකරණයේ පිස්කල්ට නියම කරමින් හා බලය දෙමින් ඒ පිස්කල් වහාම අණකළ යුතුය. ඒ ස්ථා[illegible]හි පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා එකී පිස්කල් විසි[illegible] ඒ ඔහු විසින් ඒ බලය දෙන ලද යම් පොලිස් නිලධරයෙකු විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් සහායකයන්ද, උපකරණ[illegible] යන්ත්‍ර සූත්‍ර සමග ඒ ස්ථානයට ඇතුළු වීම සඳහා ඒ පිස්කල්ට හෝ එම පොලිස් නිලධරයාට ඒ නියෝගය ප්‍රමා[illegible]කාරයක් විය යුතුය.

27. මේ ප්‍රඥප්තියේ 20 වැනි වගන්තියට [illegible] අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හා උපමානවලට අනුකූලව [illegible] කිසිම තැනැත්තෙකු විසින් වායු ගෝලය වෙත අපද්‍රව්‍ය මැහැර කිරීම හෝ ඒ තුළට පිට කිරීම හෝ නොකළ යුතුය. වායුගෝලය දූෂණය කිරීම පිළිබඳ සීමා කිරීම.

28. (1) කිසිම තැනැත්තෙකු විසි[illegible] [illegible] ගෝලය අපවිත්‍රවීම, අහිතකරවීම, විෂවීම, අපිරිසිදු වීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට, සුබ සාධනයට, ආරක්ෂාවට හෝ දේ[illegible] වලට හානිකරවීම, සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ශාකවලට හෝ වෙනත් සියළු ආකාරයේන් ජීවීන්ට, විෂ සහිත [illegible]ම හෝ හානිකරවීම නැතහොත් ඒ වායු ගෝලය වැඩදායී ලෙස උපයෝගී කිරීමෙහි ලා හානිකරවීම සිදුවන පරිදි හෝ එසේ සිදුවේ යැයි සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි ඒ වායු ගෝලයේ භෞතික, රසායනික හෝ ජෛව වක්‍රය වෙනස්වන ආකාරයෙන් ඒ වායු ගෝලය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එහිලා අවසරදීම නොකළ යුතුය. වායුගෝලය දූෂණය කිරීම.

(2) යම් තැනැත්තෙකු විසින් –

(අ) මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් වායු ගෝලයේ ස්ථාපනය කිරීම තහනම් කරන ලද දියර හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් වායු ගෝලීය ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ වායු ගෝලය වෙත මුදාහරිනු ලැබිය හැකි යම් ආකාරයකින් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ මේ ප්‍රඥප්තිය යටතේ ඒ සඳහා නියම කරන ලද නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුවහොත් ;

(ආ) ස්වභාවය, එකතුවීම, ප්‍රමාණය හෝ විශාලත්වය හේතුකොටගෙන මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට පිළිකුල් උපදවන හෝ අහිසි ලෙස පීඩාකාරී වන ගඳ මැහැරවීමට සැලැස්වුවහොත් හෝ එහිලා ඉඩ දුනහොත් ;

(ඇ) නියමිත කාලය හෝ ආකාරය හෝ ස්ථානය නොවන අන්‍ය ආකාරයකින් අපද්‍රව්‍ය පිළිස්සුවහොත් ;

(ඈ) දූෂණය වැළැක්වීම හෝ අඩුකිරීම සඳහාත්, අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇන්ජිමකට හෝ ඉන්ධන දැවීමේ උපකරණයකට සවිකළ යුතු යැයි නියෝගවලින් නියමිත යම් යම් ක්‍රමෝපායන් සවි නොකරනු ලැබූ එවැනි අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇන්ජිමක් හෝ ඉන්ධන දැවීමේ උපකරණයක් පාවිච්චි කරනහොත් ; හෝ

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ නියෝග මගින් තහනම් කරන ලද ඉන්ධන කිසිවක් පාවිච්චි කරනහොත් හෝ පුළුස්සනු ලැබුවහොත් ;

(1) වැනි උප වගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි ඔහු විසින් ඒ උප වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතුය.

(3) (1)වැනි උප වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තෙකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේදී –

(අ) රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට සහ ඉන් අනතුරුව එම වරද සිදු කිරීම දිගටම කරනු ලබන අවස්ථාවක, එම වරද එසේ දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියක දඩයකට ඔහු යටත් විය යුතුය ; තවද,

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත වායු ගෝලය දූෂණය කිරීම මගින් වැඩිදුර හානි සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය යයි සළකනු ලබන යම් නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලෙස සහ එවැනි නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලද බවට ප්‍රමාණවත් හා පිළිගත හැකි සාක්ෂි ඒ කාලය අවසානයේ දී ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම කළ යුතුය. එම වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විටත් සිදුව ඇති හානිය නිරවද්‍ය කිරීමෙහි ලා අධිකාරිය විසින් දරනු ලැබිය හැකි වියදම් දරන ලෙස ද, අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් ඔහු වරදකරු කරනු ලැබූ දින සිට සති හයක කාලයකට පසුව, ඒ වරද දිගටම සිදු කරගෙන යනු ලබන අවස්ථාවක තව දුරටත් හානි සිදු කිරීම වැළැක්වීමෙහිලා ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් නිරවද්‍ය කිරීමේ පියවර ගනු ලබන තෙක් වායු ගෝලයේ දූෂණය සිදු කෑ ඒ ස්ථානයේ පවත්වාගෙනයනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසාදැමීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිළධරයෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් ආඥාකළ හැකිය.

(5) (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන කවර හෝ අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් මගින්, ඒ ආඥා නිකුත් කළ දිනයේ සිට පැහැදිලි දින තුනකට හෝ දින හතකට පසුව නොවිය යුතු දිනයක් විය යුතු ඒ ආඥාවේ සඳහන් දිනකට පෙර, ඒ ස්ථානයේ පවත්වාගෙනයනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙස අධිකරණයේ පිස්කල්ට නියම කරමින් හා බලය දෙමින්, ඒ පිස්කල්ට වහාම ආඥාකළ යුතුය. ඒ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා එකී පිස්කල් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් පොලිස් නිලධරයෙකු විසින් අවශ්‍ය යයි සළකනු ලබන යම් උපකරණ හා යන්ත්‍ර සූත්‍ර ද, සහායකයන් ද, සමඟ ඒ ස්ථානයට ඇතුළුවීම සඳහා ඒ පිස්කල්ට හෝ පොලිස් නිලධරයාට ඒ ආඥාව ප්‍රමාණවත් අධිකාරයක් විය යුතුය.

නියමිත පාලන උපක්‍රම සවිනොට පවත්වාගෙන යාම පැහැර හැරීම වරදක් බව.

29. මේ ප්‍රඥප්තිය මගින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් මගින් හෝ ඒ යටතේ , වායු ගෝලය දූෂණ වීම වැළැක්වීම හෝ සීමා කිරීම සඳහා වූ යම් උපක්‍රමයක් සහිතව තනනු ලැබීමට, නියම කර ඇති යම් යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ බෝට්ටුවක්, ඒ යන්ත්‍රෝපකරණය වාහනය හෝ බෝට්ටුව,එසේ තනනු නොලැබ හෝ සජ්ජිත කරනු නොලැබ සතුව සිටින පාවිච්චි කරන, මෙහෙයවන ඉදිකරන, විකුණන සවිකරන හෝ විකුණන තැනහොත් විකිණීමට හෝ සවිකිරීමට ඉදිරිපත් වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේය. මේ වගන්තිය යටතේ තනනු ලබන, සවි කරනු ලබන හෝ සජ්ජිත කරනු ලබන සියළුම උපක්‍රම අයිතිකරුගේ වියදමින් පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

පස දූෂණය කිරීම සීමා කිරීම, විධිමත් කිරීම හා පාලනය කිරීම.

30. මේ ප්‍රඥප්තියේ 20 වන වගන්තියට යටත්ව, අදාළ දිනයේ සිට බල පැවැත්වෙන පරිදි, මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හා උපමානවලට අනුකූලව හැර කිසිම තැනැත්තෙකු විසින් අප ද්‍රව්‍ය පසට බැහැර කිරීම හෝ පසෙහි තැන්පත් කිරීම හෝ නොකළ යුතුයි.

පස දූෂණය කිරීම වරදක් බව.

31. (1) කිසිම තැනැත්තෙකු විසින් පස හෝ පසෙහි නිශ්පාදනය මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යට හෝ සුභ සාධනයට විෂවීම හෝ අප්‍රවිත්‍ර වීම, හානිකර වීම හෝ හානිකර විය හැකි වීම, සත්ත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ශාකවලට හෝ වෙනත් සියළු ආකාරයෙන් ඒ ජීවීන්ට විශ සහිත වීම හෝ හානිකර වීම හෝ මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට අහිතකරවීම හෝ අතිසිලෙස පීඩාකාරීවීම හෝ සිදුවන පරිදි නැතහොත් හෝ ඉඩම ඵලදායී ලෙස පාවිච්චි කිරීමෙහිලා හානිකර වන පරිදි, හෝ එසේ සාධාරන ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි,යම් පසක් හෝ ඉඩමක මතුපිට භෞතික, රසායනික හෝ ජෛව තත්වය වෙනස් වන ආකාරයෙන් ඒ පස හෝ ඉඩමේ මතුපිට දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැළැස්වීම හෝ එහිලා අවසර දීම නොකළ යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් -

(අ) යම් පසක හෝ යම් පසක් මත යම් පසකට ප්‍රවේශ අති විය හැකි යම් ස්ථානයක මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් තහනම් කරනු ලැබූ, දියර, ඝණ හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ නියම කරනු ලැබිය හැකි නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුවහොත් ; සහ

(ආ) මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට අහිතකර වන හෝ අතිසි ලෙස පීඩාකාරීවන නැතහොත් පොළව යට ඇති ජලය දූෂණය කරවන හෝ ඊට අහිතට බලපෑම් ඇතිකරවන හෝ පස හෝ ඉඩම මතුපිට ඵලදායී ලෙස පාවිච්චි කිරීමෙහිලා හානි කරවන පරිදි කසල ගොඩක්, කුණුවලක්, පස් හා ගල් බැහැර කරන බිමක්' ගොහුරු මඩ තැන්පත් කරවන බිමක් , අපද්‍රව්‍ය විදින ළිඳක් හෝ යම් ඉඩමක පිහිටුවහොත් හෝ ඝණ හෝ දියර අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා හෝ ගබ්යන් වශයෙන් හෝ ඉඩම් අන්‍ය ආකාරයකින් පාවිච්චි කරතහොත්

(1) වන උප වගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි ඔහු විසින් ඒ උප වගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතුයි.

(3) නිර්දිෂ්ට පලිබෝධකයකු පාලනය කිරීම පිණිස නියමිත ආකාරයකින් අනුමත ඖෂධ සංයෝගයක් යෙදීම වැනි වලංගු හේතු සඳහා පූර්ව නිදහස් කිරීමේ ප්‍රදානය කරනු ලැබිය හැකිය. එසේ වුව ද එවැනි ඖෂධ සංයෝගයකින් පසට තදබල ලෙස හානි සිදු නොවිය යුතුයි.

(4) මේ වගන්තියේ විධිවිධාන අතුරෙන් කවර හෝ විධිවිධානයක් කඩකරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේදී රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද, දඩයකට සහ ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන වරදක් වන විට වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන සෑම වරදක් සඳහාම රුපියල් පන්සීයයක දඩයකට ද ඔහු යටත් විය යුතුය.

ශබ්ද දූෂණය සීමා කිරීම.

32. මේ ප්‍රඥප්තියේ 34 වැනි වගන්තියට යටත්ව, අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි කිසිම තැනැත්තෙකු විසින්, ශබ්දයක පරිමාව අධික බව හා ප්‍රමාණය සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හෝ සීමා කිරීම් ඒ තැනැත්තා විසින් පිළිපදිනු ලබන්නේ නම් මිස, එවැනි අධික ශබ්දයක් පිට කිරීමට ඔහු විසින් අවසර දෙනු නොලැබිය යුතුයි.

ඇතැම් ශබ්ද විහිදුවීම සඳහා බලපත්‍ර දිය යුතු බව.

33. (1) මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරිය යටතේ හැර, කිසිම තැනැත්තෙකු විසින් දැරිය හැකි ප්‍රමාණයේ ශබ්ද සඳහා නියම කර ඇති මට්ටමේ පරිමාවට අධික බවට හෝ ප්‍රමාණයට වඩා ශබ්දයක් ඇති කිරීමට හෝ පිට කිරීමට නැතහොත් ඇතිකරනු ලැබීමට හෝ පිට කරනු ලැබීමට සැළැස්වීම හෝ එහිලා අවසර දීම නොකළ යුතුයි.

(2) 21 වැනි හා 22 වැනි වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වැන උප වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(3) මේ ප්‍රඥප්තියෙහි සඳහන් කරුණු වලින් කිසිවකට අදාළව බලපත්‍ර නිකුත් කිරීමට වෙනත් යම් ලිඛිත නීතියකින් බලය පවරනු ලැබ ඇති යම් අධිකාරියක් හෝ ආයතනයක්, මේ ප්‍රඥාප්තිය යටතේ නිශ්චිත ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියා කළ යුතුයි.

අධික ශබ්දය වරදක් බව.

34. (1) බලපත්‍රයක් නොමැතිව හෝ මේ ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍රයක් යටත් වන්නේ නම් කොන්දේසියකට, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට ද, ඒ කොන්දේසියට සීමා කිරීමට හෝ තහනම් කිරීමට පටහැනිව අවස්ථානුගත කරුණු අනුව මධ්‍යස්ථ ප්‍රමාණයේ ශබ්දයක් වන්නා වූ ශබ්දයක් පිට කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි ප්‍රමිතියට වඩා පරිමාවෙන්, අධික බවෙන් හෝ ප්‍රමාණයෙන් අධික ශබ්දයක් ඇති කරන හෝ පිට කරන නැතහොත් ඇති කරනු ලැබීමට හෝ පිට කරනු ලැබීමට සලස්වන හෝ එහිලා අවසර දෙන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තෙකු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු වූද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද, දඩයකට සහ ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන වරදක් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසුව, ඒ වරද නොකඩවා කරගෙන යනු ලබන සෑම දිනයක්ම සඳහාම රුපියල් පන්සියක දඩයකට ද ඔහු යටත් විය යුතුය.

කුණු රොඩු ඉවත් කිරීමට දැන්වීම.

35. පොදු හෝ පෞද්ගලික හෝ යම් ස්ථානයක තැන්පත් කර ඇති කුණු රොඩු කිසිවක් මගින්, මහජනයාගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුබසාධනයට හානිකර වන්නා වූ හෝ හානිකර විය හැකි වන්නා වූ, හෝ මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියයන්ට අහිත ලෙස පීඩාකාරී වන්නා වූ හෝ පරිසරයට අන්තරාදායක වන්නා වූ ආකාරයට අවස්ථානුගත කරුණු එළඹ ඇති බවට අධිකාරයේ මතය වන අවස්ථාවක , අධිකාරය විසින් ලියැවිල්ලකින් දැන්වීමක් මගින් ඒ කුණු රොඩු ඉවත් කරන ලෙස හෝ ඒ කුණු රොඩු වලට අදාළව ඒ දැන්වීමෙහි සඳහන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස, ඒ කුණුරොඩු තැන්පත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට හෝ ඒ කුණු රොඩු බැහැර කිරීම හෝ ඉවත් කිරීම ස්වකීය කර්තව්‍ය වන යම් රජයේ අධිකාරියකට හෝ විධාන කළ හැකිය.

මේ වගන්තියේ කාර්යය සඳහා "කුණු රොඩු " යන්නෙන් නිෂ්පාදන ක්‍රියාවලියක දී මතු වූ අතුරු නිෂ්පාදිතයක් හෝ එහි වැඩදායක ක්‍රියාකාරී ජීවය අවසන් කර ඇති හා ඉවතලා ඇති නිෂ්පාදිතයක් හෝ වන්නා වූ අනවශ්‍ය අපද්‍රව්‍යයක් අදහස් වේ.

කුණු රොඩු ඉවත් කිරීමේ ගාස්තුව ඊට වගකිව යුතු තැනැත්තාගෙන් අය කර ගත හැකි බව.

36. 35 වැනි වගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමක් අනුව කුණු රොඩු ඉවත් කිරීමේ හෝ අන්‍ය ආකාරයකින් බැහැර කිරීමේ හෝ අඩු කිරීමේ ගාස්තුව අධිකාරියට ලැබිය යුතු ණයක් වශයෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක ඒ කුණු රොඩු තැන්පත් කරන ලද බවට ඔප්පු වූ යම් තැනැත්තෙකුගෙන් අය කර ගනු ලැබිය හැකි අතර, ඒ ගාස්තුව එසේ අයකර ගනු ලැබූ විට අධිකාරයේ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

දැන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම වරදක් බව.

37. 35 වැනි වගන්තිය යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක් යොමු කරනු ලැබුවේ යම් තැනැත්තෙකුටද ඒ තැනැත්තා සාධාරණ හේතුවක් නොමැතිව ඒ දැන්වීමේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලද බව ඔප්පු කරනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු විය යුතුය.

පළාත් සභා සීමාවට අයත් දේශීය ජල තීරය තුළට තෙල් බැහැර කිරීම තහනම් කිරීම.

38. (1) කිසිම තැනැත්තෙකු විසින් තෙල් කිසිවක් හෝ තෙල් අඩංගු යම් මිශ්‍රණයක් හෝ වයඹ පළාතේ දේශීය ජල තීරය තුළට පිට කිරීම හෝ වැක්කිරීම නොකළ යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද, දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ යටත් විය යුතුයි.

යම් ද්‍රව්‍යයක් හෝ උපකරණයක් පාවිච්චි කිරීම තහනම් කිරීම හෝ පාවිච්චි කරන ලෙස නියම කිරීමට ඇති බලය.

39. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ඒ නියමයේ සඳහන් ප්‍රදේශ ඇතුළත පරිසරයේ ගුණාත්මක භාවයට අන්තරාදායක වන :-

(අ) යම් ද්‍රව්‍ය යම් කාර්යාවලියක්, වෙළඳමක් හෝ කර්මාන්තයක් සඳහා පාවිච්චි කිරීම තහනම් කිරීම;

(ආ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් විස්තර කිරීම අනුව හෝ වෙළඳ ලකුණු අනුව පාවිච්චි කිරීම තහන කිරීම ;

කළ හැකිය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අදාළ අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි සඳහන් ප්‍රදේශ ඇතුළත යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් ඉදිකරන ලෙස, අළුත් වැඩියා කරන ලෙස, පවත්වාගෙන යන ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස නියම කරනු ලැබිය හැකිය.

(3) (1) වැනි හා (2) වැනි උප වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක වූ යම් තහනම් කිරීමක් කඩ කරන හෝ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුයි.

සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

40. මේ ප්‍රඥප්තියේ මේ කොටස යටතේ වරද සම්බන්ධයෙන් වූ නඩු පැවරීමකදී ලේකම්වරයාගේ අත්සණ යටතේ නිකුත් කරන ලද සහතිකයක සඳහන් පරිසර දූෂණය ඒ පරිසරයට කර ඇති බවට ඒ සාක්ෂි වශයෙන් ඒ සහතිකය ආවේශන කරනු ලැබිය යුතු අතර, එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් එය මුල් බැල්මට පෙනෙන සාධකයක් ද වන්නේය.

## VII වැනි කොටස

## ව්‍යාපෘතියක් අනුමත කිරීම

ව්‍යාපෘතීන් අනුමත කිරීමේ අනුයෝජිත ආයතන.

41. (1) මේ ප්‍රඥප්තියේ මේ කොටසේ කාර්යය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විය යුතු (මේ කොටසේ මෙහි මින් මතු "පාරිසරික අනුයෝජිත ආයතන" වෙනුවෙන් ද සඳහන් කරනු ලබන) පළාත් පාරි‍ෙක අනුයෝජිත ආයතනය හෝ ආයතන නම් කරනු ලැබිය හැකි

(2) එම පාරිසරික අනුයෝජිත ආයතන විසින් විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සීමාවන්ට හා කොන්දේසිවලට හා නියෝගවලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

(3) එකී පාරිසරික අනුයෝජිත ආයතන අවලංගු කිරීමට හෝ අත් හිටුවීමට ද, නැවත සංස්ථාපනය කිරීමට ද, විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි ක්‍රියා කළ හැකිය.

නියමිත ව්‍යාපෘති.

42. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් විෂය භාර අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ මේ කොටසේ විධිවිධාන යටතේ අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන්නා වූ (මෙහි මින් මතු "නියමිත ව්‍යාපෘති" යන්නෙන් සඳහන් කරනු ලබන) ව්‍යාපෘති හා ව්‍යාපාර විනිශ්චය කරනු ලැබිය යුතුය.

නියමිත ව්‍යාපෘති අනුමත කිරීම.

43. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කෙසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට හා ඉන් පසුව ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, සමාගමක්, ව්‍යාපාරික ආයතනයක්, හෝ පුද්ගලයෙක් විසින් වයඹ පළාත තුළ ආරම්භ කරනු ලබන සියළුම නියමිත ව්‍යාපෘතියක් විසින් ඒ නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ අනුමැතිය ලබා ගත යුතු ලෙස නියම කරනු ලැබේ.

(2) (1) වැනි උප වගන්තියෙහි සඳහන් අනුමතිය ඒ නියමිත ව්‍යාපෘතියට අදාළ හෝ ඒ හා සම්බන්ධ ව්‍යාපෘති අනුමත කිරීමේ පාරිසරික අනුයෝජිත ආයතනයෙන් ලබා ගනු ලැබිය යුතුය.

එසේ වුවද විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ඇතැම් නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පාරිසරික අනුයෝජිත ආයතන විසින් හුදෙක් පළාත් අධිකාරයේ එකඟත්වය ඇතිව අනුමැතිය ප්‍රදානය කරනු ලැබේ.

(3) යම් පාරිසරික අනුයෝජිත ආයතනයක් මෙම ප්‍රඥප්තියේ හෝ නියෝගවල විධිවිධාන උල්ලංඝණය කර හෝ මෙම විධිවිධාන වලට පටහැනි බලපත්‍රයක් නිකුත් කර ඇති බව අනාවරණය වුවහොත් එම බලපත්‍රය අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ බලය පළාත් අධිකාරිය සතුවේ.

පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව ඉදිරිපත් කිරීම.

44. (1) යම් ව්‍යාපෘතියකට අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් නියම කළ හැකි පරිදි වූ ද, තත් කාර්යය සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කළ හැකි යම් තොරතුරු හා විස්තර ඇතුළත් වන්නා වූ ද මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් නිශ්චිත කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ස්වකීය අනුමැතිය සඳහා යම් නියමිත ව්‍යාපෘතියක් ඉදිරිපත් කරණ යම් පළාත් සභා දෙපාර්තමේන්තුවකින්, ව්‍යවස්ථාපිත මණ්ඩලයකින්, පළාත් පාලන ආයතනයකින්, සමාගමකින් රාජ්‍ය හෝ ව්‍යාපාරික ආයතනයකින් හෝ පුද්ගලයකුගෙන් ඉල්ලා සිටීමට සෑම පාරිසරික අනුයෝජිත ආයතනයකම යුතුකම විය යුතුය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පනවා ඇති නියමයට අනුකූලව ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවෝචිත පරිදි මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් හෝ ලැබුණු විට ඒ ව්‍යාපෘතිය අනුමත කිරීමේ පළාත් අනුයෝජිත ආයතනය විසින් ගැසට් පත්‍රයේ ද සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවෙන් පළවන එක් ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලබන දැන්වීමක් මගින් එම වාර්තාව මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ස්ථාන හා වේලාව දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ අදහස් කිසිවක් දැන්වීමට ඇත්නම් එසේ දක්වන ලෙස මහජනයාට අරාධනා කළ යුතුය.

(3) (2) වැනි උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ දින සිට දින 30ක් ඇතුළත මහජනයාගෙන් යම් සාමාජිකයකු විසින් එම දැන්වීම පළකල පාරිසරික අනුයෝජිත ආයතන වෙත ඒ පිළිබඳව තමාගේ අදහස් කිසිවක් ඇත්නම් ඒ අදහස් දැක්විය හැකි ය.

තවද තමන්ගේ අදහස් සනාථ කිරීම සඳහා කරුණු දැක්වීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට දීම මහජන යහපත පිණිස වේ යයි එම ආයතන විසින් සළකනු ලබන අවස්ථාවක එම ආයතනය විසින් එම තැනැත්තාට එසේ කරුණු දැක්වීමේ අවස්ථාවක් ලබාදිය හැකි අතර එම නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ස්වකීය අනුමැතිය දිය යුතු යයි තීරණය කිරීමෙහිලා ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් එකී කරුණු දැක්වීමේ දී හෙළි කරන ලද අදහස් සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් සැළකිල්ල දක්වනු ලැබිය යුතුය.

කාර්ය පරිපාටිය නියමිත මාර්ගෝපදේශ පදනම් කරගත යුතුවේ.

45. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන නියමිත ව්‍යාපෘති කිසිවක් අනුමත කිරීමෙහිලා අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය ඒ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් තීරණය කරනු ලැබිය යුතුය. ඒ කාර්යය පරිපාටිය අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා නියම කරනු ලබන මාර්ගෝපදේශ අනුව පදනම් කර ගත යුතුය.

විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීම.

46. (1) ස්වකීය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද යම් නියමිත ව්‍යාපෘතියක් සඳහා අනුමතිය දීම ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඒ තීරණයට විරුද්ධව විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට අසන්තුෂ්ටව පත් තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට අයිතිවාසිකමක් තිබිය යුතුය.

(2) එවැනි අභියාචනයක් මත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතුය. විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා එකී තීරණය ගැනීමට පෙර උපදේශක සභාවේ නිර්දේශද ලබාගත යුතුය.

යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දැමීම හෝ වෙනස් කිරීම.

47. අනුමතිය ප්‍රදානය කොට යම් නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වෙනස් කිරීම් කිසිවක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ දැනටමත් අනුමත කොට ඇති යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දමනු ලබන අවස්ථාවක එවැනි අනුමතියක් ලබාගත් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, ව්‍යාවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන, සමාගම්, රාජ්‍ය හෝ වෙළඳ ආයතන හෝ පුද්ගලයා විසින් උචිත ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අවස්ථාවෝචිත පරිදි ඒ වෙනස් කිරීම හෝ අතහැර දැමීම පිළිබඳ දැනුම් දිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවක දැනටමත් අනුමතිය ප්‍රදානය කොට ඇති එවැනි නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කිරීමට අදහස් කරනු ලබන වෙනස් කිරීම් කිසිවක් සම්බන්ධයෙන් නැවත අනුමතිය ලබාගත හැකිය.

එසේ වුවද අතහැර දමනු ලබන හෝ වෙනස් කරනු ලබන ඒ නියමිත ව්‍යාපෘතිය, අධිකාරයේ එකඟත්වය ඇතිව අනුමත කරන ලද ව්‍යාපෘතියක් වන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් පළාත් පාරිසරික අධිකාරියට ද දැනුම් දෙනු ලැබිය යුතු අතර, ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ යම් අලුත් අනුමතියක් අධිකාරයේ එකඟත්වය ඇතිව පමණක් දෙනු ලැබිය යුතුය.

අනුමත නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

48. (1) ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් අනුමතය ප්‍රදානය කරන ලද එක් එක් නියමිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වාර්තාවක් පළාත් අධිකාරය වෙත ඉදිරිපත් කිරීම ඒ සෑම පාරිසරික අනුයෝජිත ආයතනයේ ම යුතුකම විය යුතුයි.

(2) (අ) අනුමැතිය රහිත යම් දෑ ඉවත් කිරීමේ බලය, වයඹ පළාත් සභා බල ප්‍රදේශය ඇතුළත මෙම ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගෙන විස ඉදිකිරීමට හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුතුව ඇති යම් ඉදිකිරීමක්, හෝ පරිසර ආරක්ෂාවට බාධා කරන යම් බාධකයක් හෝ ප්‍රසර්පනයක් වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස ඒ ඉදිකිරීම, ව්‍යාපාරය, ව්‍යාපෘතිය බාධකය හෝ ප්‍රසර්පනය ඉදිකළ හෝ පවත්වාගෙන යන හෝ භාරව සිටින හෝ පදිංචිව සිටින හෝ සන්තකය දරන හෝ යම් තැනැත්තෙකු වෙත පළාත් අධිකාරිය විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකු හෝ පාරිසරික අනුයෝජිත ආයතනයක් මගින් වාචිකව හෝ ලිඛිතව නියමයක් කිරීම නීත්‍යානුකූල වන අතර, ඒ නියමය ලැබූ තැනැත්තා විසින් පළාත් අධිකාරය වෙත නියම කරනු ලැබූ කාලය තුළදී ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ඒ නියමය කරනු ලැබිය යුතු පුද්ගලයා කවුරුන්ද යන වග සම්බන්ධයෙන් යම් සැකයක් ඇතිනම් පළාත් අධිකාරිය විසින් සලකනු ලබන යුක්ති සහගත කාලයක් තුළ එහි නියමය එකී ස්ථානයෙහි හෝ ඉදිකිරීමේ හෝ සවිකිරීමේ හෝ අලවා තැබීමෙන් අනතුරුව පළාත් අධිකාරිය විසින් ම යම් සේවකයන් හෝ යන්ත්‍ර සූත්‍ර යොදවා හෝ වෙනයම් සුදුසු යැයි හැඟෙන ආකාරයකින් එම ඉදිකිරීම හෝ බාධකය හෝ ප්‍රසර්පනය වහාම ඉවත් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේය.

(ආ) එසේ යම් ඉදිකිරීමක්, බාධකයක් හෝ ප්‍රසර්පයක් ඉවත් කිරීම සඳහා පළාත් අධිකාරය විසින් බලය දෙනු ලැබූ තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් අවශ්‍ය විය හැකි මිනිස් ශ්‍රමය, යන්ත්‍ර සූත්‍ර, හෝ ගව, ඇත්, ආදී සත්ව ශ්‍රමය ද, යම් උපකරණ සමඟ එකී ස්ථානයට, භූමියට හෝ ගෙයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළත් වීම හා එසේ ඇතුළත්වී එලෙස ඉවත් කිරීම හෝ අස්කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියා මාර්ග ගැනීම නීත්‍යානුකූල වන්නේය.

(ඇ) එසේ ක්‍රියා කිරීමේදී යම් බාධාවක් පමුණුවන යම් තැනැත්තෙකු වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි හෝ වර්ෂ දෙකකට නොවැඩි දෙආකාරයෙන් එක් ආකාරයකට සිර දඬුවමකට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

(ඈ) එසේ ඉවත් කිරීමේදී පළාත් අධිකාරිය විසින් කරනු ලැබූ සියලු වියදම් එම ඉදිකිරීම, බාධකය හෝ ප්‍රසර්පනයකට අයත් ද්‍රව්‍ය. උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, ආදිය විකිණීමෙන් පියවා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

(ඉ) එසේ පියවා ගත නොහැකි විට එම අලාභය දඩයක් වශයෙන් අදාළ අයගෙන් අයකර ගැනීම සඳහා උසාවි නියෝගයක් ලබා ගත හැකි වන්නේය.

## *VIII* වැනි කොටස

### සාමාන්‍ය

තොරතුරු ලැබීම

49. (1) මේ ප්‍රඥප්තියේ සිද්ධාන්ත සහ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරය විසින් පරිශ්‍රයක පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් දින දහ හතරක් ඇතුළත හෝ දැන්වීමේ සඳහන් කර ඇති ඊට වඩා දීර්ඝ කාලයක් ඇතුළත ඒ පරිශ්‍රයේ පවත්වාගෙන යන්නා වූ යම් නිෂ්පාදන කාර්මික හෝ වෙළඳ පිරි සැකසුම් පිළිබඳව හෝ එකී පරිශ්‍රයෙන් පිට කරන හෝ පිට කරනු ලැබීමට ඉඩ ඇති ඒ දැන්වීමේ සඳහන් අපද්‍රව්‍ය පිළිබඳව පළාත් අධිකාරය වෙත තොරතුරු සපයන ලෙස එම පදිංචිකරුට නියම කළ හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ කරන ලද යම් නිගමනයකට අනුව අධිකාරයට සපයන ලද සියළු තොරතුරු පළාත් පාරිසරික අධිකාරය විසින් අතිශය රහස්‍ය ලෙස සැළකිය යුතු අතර, (3) වැනි උප වගන්තියට යටත්ව, මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක කාර්යය සඳහා අධිකරණයට හැර ඒ තොරතුරු වෙනත් යම් තැනැත්තෙකුට හෙළිදරව් නොකළ යුතුය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අනුව පළාත් පාරිසරික අධිකාරියට සපයන ලද යම් තොරතුරක් හෝ කරන ලද ප්‍රකාශයක්, තොරතුරු සපයන හෝ ප්‍රකාශ කරන තැනැත්තා තමා අපරාධ චෝදනාවකට ලක්වීමට ඉඩ ඇති බවට ඒ තොරතුරු සපයන හෝ ප්‍රකාශය කරන අවස්ථාවේදී විරෝධය දක්වා ඇත්නම් මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් එම තැනැත්තාට විරුද්ධව යම් නඩු කටයුත්තකදී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොවිය යුතුය.

50. (1) පළාත් අධිකාරයේ ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් කවර හෝ වේලාවක යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුව — ඇතුළු වී සෝදිසි කිරීමේ බලය.

(අ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් පරීක්ෂා කිරීම හා සෝදිසි කිරීම ;

(ආ) එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කරනු ලබන, බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන, නැතහොත් සාමාන්‍යයෙන් පිට කරනු ලබන, බැහැර කරනු ලබන, හෝ තැන්පත් කරනු ලබන සංඝටක හෝ වර්ගයක විය හැකි යම් දූෂණ කාරකයන්ගේ සැම්පල ගැනීම ;

(ඇ) ඒ උපකරණයේ හෝ කාර්මික පිරියතෙන් ක්‍රියාකාරිත්වයට හෝ පාවිච්චියට අදාළ වූ හෝ එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කිරීමට, බැහැර කිරීමට, හෝ තැන්පත් කිරීමට, අදාළ වූ යම් පොත්, වාර්තා, හෝ ලේඛණ පරීක්ෂා කිරීම ;

(ඈ) ඒ උපකරණයේ හෝ කාර්මික පිරියතේ ඡායාරූපයක් ගැනීම හෝ අවශ්‍ය යැයි තමා සළකන එම පරීක්ෂණය පවත්වා ගෙන යාමේ දී දක්නට ලැබෙන යම් පොත්වල, වාර්තාවල හෝ ලේඛණවල පිටපත් ගැනීම හෝ ;

(ඉ) එම පරිශ්‍රය තුළ හෝ ඒ මත පවත්වා ගෙන යනු ලබන එම වෙළඳාමෙහි, කර්මාන්තයෙහි හෝ කාර්යාවලියෙහි පාවිච්චි කරනු ලබන, පාවිච්චි කරනු ලැබිය හැකි හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් ඉන්ධනයක, වස්තුවක හෝ ද්‍රව්‍යයක සැම්පල ගැනීම ;

කළ හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ එම කාර්යයන් ඉටු කිරීමේදී යම් තදබල බාධක ඇතිවිය හැකි බවට ලේකම්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිළධරයාට හෝ සාධාරණ හේතු පෙනී යන අවස්ථාවක ඔහුට පොලිස් නිළධරයකු සමග යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළුවිය හැකිය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ එවැනි සෝදිසි කිරීමක් හෝ විමර්ශණයක් කරගෙන යාමේදී දත්ත සටහන් කිරීමේදී හෝ සැම්පල ගැනීමේදී පළාත් අධිකාරයේ ලේකම් හෝ බලය ලත් නිළධරයෙකු හෝ වළක්වන නැතහොත් පළාත් අධිකාරයේ ලේකම්වරයාට හෝ බලය ලත් නිළධරයාට බාධා පමුණුවන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

51. (1) පරිසරයට හානියක් හෝ අනර්ථයක් සිදු කරන හෝ සිදුවීමට ඉඩ ඇති යම් සංවර්ධන ව්‍යාපෘතියක හෝ යෝජනා ක්‍රමයක නිරතව සිටින හෝ නිරතවීමට ආසන්න යම් තැනැත්තෙකු වෙත ඒ හානිය හෝ අනර්ථය වැළැක්වීම හෝ නතර කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට පළාත් අධිකාරියට බලය ඇති අතර, එම විධාන අනුව ක්‍රියාකිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතුය. පළාත් අධිකාරිය විසින් විධාන නිකුත් කළයුතු බව.

(2) (1) වැනි උප වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තෙකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ විධානයේ සඳහන් පියවර ඒ තැනැත්තා විසින් ගනු ලබන තෙක් මහේස්ත්‍රාත්වරයා විසින් පළාත් අධිකාරිය විසින් කරනු ලබන ඉල්ලීම මත ඒ ව්‍යාපෘතිය හෝ යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවන ලෙස ආඥා කළ හැකිය.

52. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛණයේ I වැනි ලැයිස්තුවේ II වැනි පරිශිෂ්ඨයේ විධිවිධාන වලට යටත්ව, යම් ප්‍රදේශයක් (මෙහි මින්මතු "ආරක්ෂිත ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාරිසරික ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කළ හැකිය. පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වශයෙන් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

(2) ප්‍රදේශයක්, ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන (1) වැනි උප වගන්තිය යටතේ වූ නියමයක් මගින් ඒ ප්‍රදේශයේ යම් සළකුණු හා සීමා දැක්වීමෙන් ඒ ප්‍රදේශයේ මායිම් නියම කළ යුතුය.

53. (1) යම් ප්‍රදේශයක්, 52 (1) වැනි වගන්තිය යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් විෂය භාර අමාත්‍යවරයා විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන කිසිවක් සමග ගැටෙන්නා වූ යම් නීතියක විධිවිධාන යටතේ ඒ ආරක්ෂිත ප්‍රදේශයේ වූ යම් සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් හෝ කිසියම් කර්මාන්තයක් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක වීම නතරවිය යුතු යයි ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකිය. ආරක්ෂක ප්‍රදේශ තුළ වෙනත් යම් නීති අදාළ වීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමයක් බලාත්මකව පවත්නා තාක් කල්, මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව ඒ ප්‍රදේශයේ හොඳින් සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් පළාත් අධිකාරිය වගකිව යුතුය.

(3) (1) වැනි උපවගන්තියේ විධිවිධාන කෙසේ වුවද ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් අධිකාරිය, ඒ ආරක්ෂිත ප්‍රදේශයේ සැලසුම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වගකීම දැරීම නතර විය යුතු බව පළාත් අධිකාරියේ ඉල්ලීම පිට අදාළ අමාත්‍යවරයා විසින් කලින් කළ ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(4) ආරක්ෂිත ප්‍රදේශයකට අදාළව 52 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් බලාත්මකව පවත්නා තාක් කල් පළාත් අධිකාරිය නොවන කිසිම තැනැත්තෙකු විසින් ඒ ආරක්ෂිත ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ බලතල කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම නොකළ යුත්තේය.

(5) ආරක්ෂිත ප්‍රදේශයකට අදාළව 52 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් බලාත්මකව පවත්නා තාක් කල් පළාත් අධිකාරිය නොවන කිසිම තැනැත්තෙකු විසින්, ඒ ආරක්ෂක ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම නොකළ යුත්තේය.

54. පළාත් අධිකාරිය විසින් -

(අ) මේ පනතේ කාර්යය සඳහා ගන්නා ලද සැම්පල් විශ්ලේෂණය කිරීම පිණිස රස පරීක්ෂකයන් ; සහ

(ආ) පරිසරයේ ග්‍රාහක කොටස්වලට, අපද්‍රව්‍ය එකතුවී ඇති බව, ඒ අපද්‍රව්‍යවල ප්‍රමාණය සහ ස්වභාවය ද පරිසරයේ ග්‍රාහක කොටස් කෙරෙහි ඒ අපද්‍රව්‍යවලින් ඇති කෙරෙන බල පෑම ද සොයා ගැනීම සඳහා වූ නියමිත උපකරණ සහ සවිකිරීම් සමීක්ෂණය කිරීමේ වාර්තා පරීක්ෂා කිරීම සහ ඇගැයීම් සඳහා පරිසර දූෂණ පාලනය සඳහා අවශ්‍ය නිලධරයන් ;

පත් කරනු ලැබිය හැකිය.

55. (1) (5) වැනි වගන්තියට යටත්ව පළාත් අධිකාරිය විසින් නියමයක් මගින් මේ පනත යටතේ පළාත් අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනකට හෝ යම් නිලධරයෙකුට පවරා දෙනු ලැබිය හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ පළාත් අධිකාරිය විසින් යම් බලයක් පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් නිලධරයෙකුට පවරා දෙනු ලැබූ අවස්ථාවක, ඒ බලතලවලින් කිසිවක් පළාත් අධිකාරියේ ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරන ලද්දේ නම්, ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිව තිබුණු බලතලවලින් ලේකම්වරයා ක්‍රියාත්මක නොකළ කිසිවක් අවස්ථාවෝචිත පරිදි ඒ පළාත් සභා දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ යම් නිලධරයෙකු විසින් හෝ ඒ නිලධාරියා විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(3) පරිසරය ආරක්ෂා කිරීමට සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ඇති පළාත් අධිකාරිය සතු යම් වගකීමකට හෝ බලයකට මේ වගන්තියේ වූ කිසිවකින් බාධාවක් නොවිය යුතුය.

(4) (1) වැනි උපවගන්තිය යටතේ කරන ලද නියමයක් පළාත් අධිකාරිය විසින් කරවූ අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකිය.

(5) පළාත් අධිකාරිය විසින් (1) වැනි උපවගන්තිය යටතේ,

(අ) විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර, යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් සහ,

(ආ) යම් පළාත් සභා දෙපාර්තමේන්තුවක්, ආයතනයක් හෝ නිලධාරියෙක් සම්බන්ධයෙන් වූ විටක, ඒ පළාත් සභා දෙපාර්තමේන්තුවට, ආයතනය හෝ නිලධාරියා භාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර,

නියමයක් නොකළ යුතුය.

පළාත් අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

56. පළාත් අධිකාරියේ සියළුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

පළාත් අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛණගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

57. පළාත් අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛණගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

58. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන වයඹ පළාත් තුළ බලපැවැත්විය යුතුය. තව ද මේ ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර, යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත් මේ ප්‍රඥප්තියේ විධිවිධාන වයඹ පළාත් තුළ ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිභවා බලපැවැත්විය යුතුය.

මේ ප්‍රඥප්තිය (අනුව) හෝ පළාත් අධිකාරියේ විධිවිධාන පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම.

(2) එසේ වුවද, ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාර්ලිමේන්තු පනත යටතේ දැනටමත් පවත්වාගෙන යනු ලබන හෝ ඉදිරියට පවත්වාගෙන යනු ලැබිය හැකි හෝ ක්‍රියා පරිපාටියට බාධාවක් නොවනු පිණිස හෝ එය වඩා ඵලදායි වනු ඇතැයි හෝ විෂය භාර අමාත්‍යවරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක මෙම ආඥාපනතේ ඊට අදාල විධිවිධාන හෝ සම්පූර්ණ ප්‍රඥප්තියම හෝ ක්‍රියාත්මක කිරීම තාවකාලිකව හෝ දින නියමයක් නැතිව හෝ අත්හිටුවනු ලැබීමට විෂය භාර අමාත්‍යවරයාට හැකිය.

ත කරන ලදුව
ව පිණිස මෙහි
ානායක,

(3) එසේ අත්හිටුවනු ලැබීමට හෝ එම අත්හිටුවීමේ නියමය නැවත ඉවත් කරනු ලැබූ විට හෝ ඒ බව ගැසට් නිවේදනයක් මගින් හා සිංහල දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන් පළ වන දිනපතා පුවත්පත්වලින් අවම වශයෙන් එකක මැගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

සභාව.

59. (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධානය පිට පළාත් අධිකාරියේ, පළාත් පාරිසරික උපදේශක සභාවේ හෝ පාරිසරික අනුයෝජිත ආයතනයක සාමාජිකයන් හෝ පළාත් අධිකාරියේ යම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයන්ට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතුය.

මේ ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධාන පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීම.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි පළාත් අධිකාරිය විසින් හෝ පළාත් අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් පළාත් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී පළාත් අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ පළාත් අධිකාරිය විසින් අය කරගනු ලබන යම් ගාස්තුවක් පළාත් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

නාමිය හා [illegible] වීමේ

(3) (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ පළාත් අධිකාරියේ විධානය පිට කරන ලද හෝ කරනු ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ දී ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළහොත් ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී අයකර ගනු ලැබුවේ නම් මිස, පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

! අධිකාරියක්
5ම.

60. මේ ප්‍රඥප්තිය යටතේ ඇති නියමයන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් විධිවිධාන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් හෝ ඒ විධිවිධාන හෝ නියෝග අනුව කටයුතු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ පැමිණවිය යුතු දඬුවමක් සඳහා ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නොමැති විටක, එවැනි උල්ලංඝණයක් හෝ පැහැර හැරීමක් කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේය.

කිසිම දඬුවමක් සඳහා ප්‍රකාශිතවම විධිවිධාන සලසනු ලැබ නොමැති වැරදි සඳහා දණ්ඩනය.

! අධිකාරියේ
නියමින් සහ
9.

61. (1) නියම කරනු ලැබිය යුතු යයි ප්‍රඥප්තියේ ප්‍රකාශිත හෝ නියමිත හෝ මේ ප්‍රඥප්තියෙන් නියෝග සෑදීමට අවශ්‍ය සියලු කාරණා සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

නියෝග.

(2) විශේෂයෙන්ම හා (1) වැනි උපවගන්තියෙන් කරනු ලැබූ බලතලවල ව්‍යාපකතියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය:–

(අ) (i) ඉදිකිරීම් හා සවිකිරීම්වලට හෝ යෝජිත ඉදිකිරීම් හා සවිකිරීම් වලට අදාළ පිඹුරු, පිරිවිතර සහ තොරතුරු පරීක්ෂා කිරීම ;

(ii) මේ පනත යටතේ බලපත්‍ර හෝ යම් විධානයක් නිකුත් කිරීම ; සහ

(iii) අවශ්‍ය තනු පිරික්සීමේ ඉටුකිරීම සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම.

(ආ) යම් ජාතියක හෝ පළාත් පාරිසරික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හෝ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සහ එය වැඩදායි ලෙස උපයෝගි කර ගැනීම, ආරක්ෂා කිරීම සඳහා වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමිති හෝ උපමාන දැක්වීම.

(ඇ) යම් ද්‍රව්‍යයක්, ක්‍රියාවක් හෝ දෙයක් විෂ සහිතද, අහිතකර ද, පිළිකුල් සහගත ද, සෞඛ්‍යයට හානිකර ද, යන වග නැතහොත් මේ ප්‍රඥප්තියෙහි වෙනත් යම් විස්තරයකට අයත් වේද යනවග නිශ්චය කිරීමෙහි ලා ප්‍රමිති හෝ උපමාන දැක්වීම.

(ඈ) දියර, ඝණ හෝ වායු වන්නා වූ යම් ද්‍රව්‍යයක් හෝ විකිරණශීලී යම් ද්‍රව්‍යයක් පරිසරයට මැහැර කිරීම, පිට කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම සහ යම් නිශ්චිත ඉන්ධනයක පාවිච්චිය තහනම් කිරීම හෝ එය විධිමත් කිරීම.

(ඉ) අවට ඇති වායුවේ ගුණාත්මක ප්‍රමිති සහ පිට කිරීමේ ප්‍රමිති දැක්වීම සහ වායුගෝලයේ පැවැතිය හැකි හෝ වායු ගෝලයට මැහැර කළ හැකි යම් ද්‍රව්‍යයක් එක් රැස්වීම උපරිම වශයෙන් ඉවදිය හැකි ප්‍රමාණය දැක්වීම.

(ඊ) දූෂණය සිදු වීමට සමත් යම් යන්ත්‍රයක්, උපකරණයක්, පහසුකමක්, වාහනයක් හෝ බෝට්ටුවක් පාවිච්චි කිරීම තහනම් කිරීම නැතහොත් දූෂණය වැළැක්වීම හෝ අඩු කිරීම ඇති වන පරිදි ඒවා තැනීම සවිකිරීම හෝ ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම.

(උ) දූෂණය පිළිබඳ අනතුරු ඇඟවීම් හෝ සෝදිසියෙන් සිටීමේ දැන්වීම් නිකුත් කිරීමේ අවශ්‍යතාව.

(ඌ) කසල හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම.

(එ) පොළව මත හෝ ඇතුළත ඝණ හෝ දියර අපද්‍රව්‍ය මැහැර කිරීම සඳහා ස්ථාන පිහිටුවීම විධිමත් කිරීම.

(ඒ) අමනෝඥ ශබ්ද කවරේදැයි නිශ්චය කිරීම සහ මධ්‍යස්ථ ප්‍රමාණයේ වූ ශබ්ද සඳහා ප්‍රමිති දැක්වීම.

(ඔ) සෞඛ්‍යයට හෝ සුභසාධනයට හානිකර වියහැකි වූ හෝ ප්‍රතිවිරුද්ධ සංස්කෘතික බලපෑම් ඇතිවිය හැකි වූ, නැතහොත් දූෂණය වැළැක්වීම සඳහා යම් ජල තීරයක හෝ ඒ අවට නෑම, පිහිනීම, බෝට්ටු පැදීම හෝ වෙනත් කටයුත්තක් කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම.

(ඕ) තෙල් අඩංගුවීමෙන් යම් පිටාර ගලායාමක් අඩුකිරීම හෝ වැළැක්වීමේ කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි යම් උපකරණයක්, ව්‍යාපාර කටයුතු කරගෙන යන තෙල් පිරිපහදු විසින් සවිකළ යුතු යයි නියම කිරීම.

(ක) පළාත් අධිකාරිය විසින් කරනු ලබන නිශ්චය කිරීමකට විරුද්ධව වූ අභියාචනාවලට අදාළව කාර්ය පටිපාටිය නියම කිරීම.

(ග) නාගරබද, හා ගම්බද දෘෂ්ටි ප්‍රසන්නතා ඇතිකිරීම සම්බන්ධයෙන් මාර්ග, ඉඩම් හා ගොඩනැගිලි පවිත්‍රකරණය, අලංකරණය, මනා පවැත්ම සඳහා අදාළ විධිවිධාන සහ දැන්වීම් ප්‍රදර්ශණය කිරීම විධිමත් කිරීම සහ ඉඩම් පරිහරණය හා කැමලිකිරීම සම්බන්ධ කාර්ය පටිපාටිය නියම කිරීම.

(ජ) උපද්‍රව්‍යකාරී ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම.

(ට) වායු ගෝලයට, ජලතීරයට හෝ පසට හෝ වුවද, අපද්‍රව්‍ය සහ උපද්‍රවකාරී ද්‍රව්‍ය මැහැර කිරීම.

(ඩ) රුක් රෝපණය හා කැපීම, ගෙවතු වගාව, මුඩුබිම් වගාව සහ රුක්ගොමු පිහිටුවීම හා රුක් ආරක්ෂා කිරීම හා නඩත්තුව.

(ණ) සංවර්ධන නිලධාරියෙකු විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිශ්චිත කෘෂිය පාර්ශවකරුවකු විසින් නිශ්චිත පාරිසරික කතු පිරික්සීමේ කාර්ය ඉටුකිරීම නියම කිරීම.

(ත) පළාත් පාරිසරික පනතේ සියළු බලතල හා කාර්යයන් පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කාර්ය පරිපාටිය හා විධිවිධාන පැනවීම.

(3) විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(4) විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබුවා ලෙස සළකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වීමට පෙර ක්‍රියාත්මක කරනු ලැබ තිබුනේ නම් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතුය.

62. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි –

"පරිසරය" යන්නෙන් ඉඩම්, පස, ජලය, වායු ගෝලය, දේශගුණය, ශබ්දය, දුර්ගන්ධය, රසය, සෑම ආකාරයක සතුන්ගේ හා ශාකවල ජීව් සාධක ඇතුළුව මනුෂ්‍යයන්ගේ වටපිටාවෙහි භෞතික සාධක ද වේ.

“ඉඩම” යන්නෙන් වාසස්ථාන, ගොඩනැගිලි සහ ඒවාට සම්බන්ධ පරිවශතාව හෝ සියළු ආකාරයේ පදිංචි හෝ පදිංචියකින් තොර වූ භූමි භාගයන් සහ රජය විසින් ලබාදෙන ඉඩම් ඇතුළත් වේ.

“ගොඩනැගිලි” යන්නෙන් නිවසක්, කර්මාන්ත ශාලාවක්, තාප්පයක් හෝ වෙනයම් එනැම ඉදිකිරීමක් අදහස් වේ.

“ඉදිකිරීමක්” යන්නෙන් යම් වැටක් , කවුල්ලක්, ගේට්ටුවක්, කුළුණක්, බැම්මක් හෝ කිසියම් ගොඩනැගිල්ලක් අදහස්වේ.

“පළාත් පාලන ආයතන” යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් හෝ ග්‍රාමෝදය මණ්ඩලයක් හෝ ඒ වෙනුවට පිහිටුවනු ලැබිය හැකි වෙනයම් ආයතනයක් හෝ සභාවක් ඇතුළත් වේ.

“දූෂණය” යන්නෙන් පරිසරය ඵලදායි ලෙස උපයෝගී කර ගැනීමට අහිතකර ලෙස හෝ මහජන ආරක්ෂාවට, සෞඛ්‍යයට හෝ සුභසාධනයට අහිතකර ලෙස හෝ වන සතුන්, කුරුල්ලන්, මත්ස්‍යයන්, මනුෂ්‍යයන් හා ගහ කොළ, ශාඛා හා පැළෑටි ඇතුළු සියළුම ආකාරයේ ජීවීන් අතුරෙන් යම් කොටසකට හෝ සියල්ලන්ටම හෝ උපද්‍රවකාරී ලෙස හෝ බාධාවන ලෙස හෝ අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිටකිරීමෙන්, බහා තැබීමෙන් හෝ තැන්පත් කර තැබීමෙන් පරිසරයට කිසියම් වූ හෝ ආකාරයක අහිතකර බලපෑමක් ඇතිකිරීම අදහස් වේ.

“ශබ්ද දූෂණය” යන්නෙන් කෝප ගන්වන හෝ වෙහෙසකර වූ හෝ ඇසීම දුර්වල කරන වික්ෂිප්තවීම් මගින් වෙනත් නාද හෝ ශබ්ද ඇසීමට බාධාකරවන හෝ අවධානය බිඳහෙලන අන්දමේ ශබ්දයක් හෝ නාදයක් සිදුකිරීම හෝ සිදුවීමට ඉඩ සැලසීම අදහස් කෙරේ.

“වායු දූෂණය” යන්නෙන් ශාඛා පැළෑටි, ගහකොළ හෝ වන සතුන්, කුරුල්ලන්, මනුෂ්‍යයන් ඇතුළු ජෛව සාධකයන්ට හෝ අජීවී වස්තූන්ට අනියම් විපාක ඇති කරවන වාතයෙහි භෞතික රසායනික හා ජෛව ලක්ෂණයන් වෙනස් කරවන හෝ ආශ්වාස, ප්‍රශ්වාසයට බාධා කරවන හෝ අප්‍රසන්න ගන්ධයක් හෝ ධූමයක් හෝ අහිතකර අංශු සහිත වායුවක් පරිසරයට එකතු කිරීම අදහස් කෙරේ.

“අපද්‍රව්‍ය” යන්නෙන් පවිත්‍ර නොකළ මලමුත්‍ර, කැළිකසල සත්ව හෝ ශාඛා කොටසක්, කාර්මික හෝ කෘෂි කාර්මික විෂ, රසායනික ද්‍රව්‍ය, සාමනිකණ්ඩුමය කර්මාන්ත හෝ ව්‍යාපාරය සඳහා පාවිච්චියට ගත් ද්‍රව්‍ය හෝ ද්‍රව්‍යවල ශේෂ කොටස් සහ පරිසරයට සහ මහජන සෞඛ්‍යයට අහිතකර වූ හෝ අප්‍රසන්න වූ අංශු සහිත හෝ අප්‍රසන්න ගන්ධයකින් යුතු වායු, ද්‍රව හෝ ධූමයක් අදහස් කෙරේ.

“විෂ රසායනික ද්‍රව්‍ය” යන්නෙන් සජීවී ද්‍රව්‍ය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරවන්නා වූ හෝ පරිසරයෙහි උපද්‍රවකාරී විපර්යාසයක් ඇතිකරවිය හැක්කාවූ ද්‍රවයක්, ද්‍රව්‍යයක් හෝ ධූමයක් අදහස් වේ.

“දේශීය ජල තීරය/ජල තීරය” යන්නෙන් වයඹ පළාතේ මුහුදුබඩ සීමාවට අදාළ මුහුදු වෙරළ, එම මුහුදු ජල තීරය සහ වයඹ පළාතේ භූමි සීමාව තුළ පිහිටි ගංගා, වැව්, පොකුණු, ඇළ මාර්ග, දිං උල්පත් ආදී එනැම් ජල ගබඩාවක් ද අදහස් කෙරේ.

“විෂයභාර අමාත්‍යවරයා” යන්නෙන් පළාත් පාලන විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

“ලේකම්” යන්නෙන් පළාත් පාරිසරික අධිකාරියේ සහ පළාත් පාරිසරික උපදේශක සභාවේ ලේකම් හෙවත් වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා හෝ එම කාර්ය භාර නිලධාරියා අදහස් වේ.

“සභාපති” යන්නෙන් පළාත් පාරිසරික අධිකාරියේ සභාපති හෙවත් වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා හෝ එම කාර්ය භාර නිලධාරියා අදහස් වේ.

“අදාළ අමාත්‍යවරයා” යන්නෙන් තත් කාර්ය අදාළ පළාත් අමාත්‍යවරයා අදහස් කෙරේ.

06-444/13